# වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2018

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව


| | | |
|---|---|---|
| දුරකථන | : | 011-2209800 |
| ෆැක්ස් | : | 011-2342078 |
| ඊ-මේල් | : | info@pensions.gov.lk |
| අන්තර්ජාල ලිපිනය | : | www.pensions.gov.lk |

# පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 01. | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | **1 - 4** |
| | 01. 1. හැඳින්වීම | 1 |
| | 01. 2. දැක්ම හා මෙහෙවර | 2 |
| | 01. 3. සංවිධාන සටහන | 3 |
| | 01. 4. අනුමත කාර්ය මණ්ඩලය | 4 |
| 02. | දෙපාර්තමේන්තු ක්‍රියාවලිය | **5 - 8** |
| | 02. 1. ලියාපදිංචිය | 5 |
| | 02. 2. ගෙවීම් නියාමනය | 5-6 |
| | 02. 3. ලැබීම් නියාමනය | 6-7 |
| | 02. 4. සංවර්ධන ප්‍රවේශය | 7-8 |
| | 02. 5. පසු විපරම | 8 |
| 03. | වාර්ෂික වැඩසටහන් | **9 - 14** |
| | 03. 1. ජාතික විශ්‍රාමික දින සැමරුම | 9 |
| | 03. 2. තාක්ෂණික සැසිය | 10 |
| | 03. 3. අභ්‍යන්තර පුහුණු සහ විදෙස් පුහුණු අවස්ථා කළමනාකරණය | 11-12 |
| | 03. 4. දැනුම් කළමනාකරණය | 12-13 |
| | 03. 5. බැහැරගත ක්‍රියාකාරකම් | 13-14 |
| 04. | නව හඳුන්වාදීම් | **15 - 16** |
| | 04. 1. භෞතික වැඩිදියුණු කිරීම් | 15-16 |
| | 04. 2. විෂය මූලික වැඩිදියුණු කිරීම් | 16 |
| 05. | සාධනයන් | **17** |

| | | | |
|---|---|---|---|
| 06. | විශ්‍රාම වැටුප් ගෙවීම් | | **18 - 26** |
| | 06. 1. | වාර්ෂික විශ්‍රාමිකයින් සංඛ්‍යාව | 18-22 |
| | 06. 2. | පාරිතෝෂික ගෙවීම් | 22-23 |
| | 06. 3. | හිඟ වැටුප් ගෙවීම් | 24 |
| | 06. 4. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් හා ගෙවීම් | 25 |
| | 06. 5. | ගොඩනැගිලි කුලී ලැබීම් හා නිවාඩු නිකේතන ආදායම් | 26 |
| 07. | මූල්‍ය ප්‍රකාශන | | **27 - 44** |
| | 07. 1. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 28 |
| | 07. 2. | වැඩසටහන් අනුව වියදම් සාරාංශය | 29 |
| | 07. 3. | වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය | 30 - 32 |
| | 07. 4. | වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය | 33 |
| | 07. 5. | පළාත් පාලන සේවා ගිණුම් | 34 - 38 |
| | 07. 6. | සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා හා මධ්‍යම රජය) | 39 - 40 |
| | 07. 7. | ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ගිණුම් | 41 - 42 |
| | 07. 8. | රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අවසන් ගිණුම් | 43 - 44 |
| 08. | විගණකාධිපති වාර්තා | | **45 - 84** |

## 01. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

### 01. 1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිත ආණ්ඩුව විසින් ශ්‍රී ලාංකේය රාජ්‍ය සේවකයන්ට හඳුන්වා දුන් දැවැන්ත සමාජාරක්ෂණ වැඩ පිළිවෙල වන රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් ක්‍රමයේ ආරම්භය වසර 1900 පමණ දක්වා වූ අතීතයකට දිවෙන්නකි. එහෙත් රාජ්‍ය සේවකයාගේ වියෝවෙන් ආර්ථික හා සමාජයීය වශයෙන් අසරණභාවයට පත්වන වැන්දඹුව හා අනත්දරුවන් වෙනුවෙන් වූ සමාජාරක්ෂණ ක්‍රමයක් ඊට පෙර තිබූ බවට සාක්ෂි සපයන්නේ 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනතයි. මෙම පනත සහ වර්ෂ 1934 පෙබරවාරි මස 05 දින ස්ථාපිත කරන ලද විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යන නෛතික ලියවිලිවලින් බලපැවැත්වෙන පරිදි රාජ්‍ය සේවාවේ විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ශ්‍රී ලංකා රජයේ නීතියක් ලෙස නීතිමය වශයෙන් ස්ථාපිත වන්නේ ය.

1934 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයට අවස්ථා ගණනාවකදී සිදු කරන ලද සංශෝධනයන්ට හා 1972 මැයි මස 05 දින සිදු කරන ලද සංශෝධනයන්ට යටත්ව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක වේ.

එමෙන්ම 1898 අංක 01 දරණ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් පනත ද 1981 අංක 44 දරණ වැන්දඹු හා අනත්දරු අරමුදල් සංශෝධන පනත යටතේ ආබාධිත විශ්‍රාම වැටුප් ක්‍රමය ඇතුලත් කරමින් ප්‍රතිලාභ අවස්ථා පුළුල් කිරීම සිදු වී වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රමය ක්‍රියාත්මක වේ. මෙකී සංශෝධනයන්ට යටත්ව 2010 අංක 08 සහ 09 දරණ පනත් සංශෝධනයන්ගෙන් තවදුරටත් වැන්දඹු හා අනත්දරු සහ ආබාධිත විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ පුළුල් වී ඇති අතර දැනට ක්‍රියාත්මක වන්නේ එකී පනතයි.

එමෙන්ම 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනත ප්‍රකාරව ක්‍රියාත්මක වන රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල ද මීට සමගාමීව රාජ්‍ය සේවයේ ම තවත් සේවක පිරිසකගේ සමාජාරක්ෂණ ක්‍රියාවලිය සවිබල ගන්වයි.

මෙකී විෂය ත්‍රිත්වය නීති ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම උදෙසා වසර 1970 දෙසැම්බර් 23 දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන A ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් වශයෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

**දැක්ම**

ආර්ථික හා සාමාජීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ප්‍රජාවක්

**මෙහෙවර**

රාජ්‍ය සේවා විශ්‍රාමිකයන් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන් සඳහා තොරතුරු තාක්ෂණය හා තිරසාර කළමනාකරණ ක්‍රමවේද භාවිතයෙන් ද, පෞද්ගලික හා රාජ්‍ය අංශ මුහුවෙන් ඉහළ සේවාලාභී හා සේවාදායක තෘප්තිය තහවුරු කරමින් නෛතික ප්‍රතිලාභයන් පිළිගැන්වීම

# සංවිධාන සටහන




වි.වැ.නි - විශ්‍රාම වැටුප් නිලධාරි
අ.ස - අයවැය සහකාර
ලේ.ස - ලේඛණ සහකාර
කා.සේ.සේ. - කාර්යාල සේවක සේවය

ස.නි - සංවර්ධන නිලධාරි
රා.ක.ස - රාජ්‍ය කළමනාකරණ සහකාර
තො.තා.නි. - තොරතුරු තාක්ෂණ නිලධාරි
බ.හා. - බංගලා භාරකරු

## විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය-2018.12.31දිනට

| තනතුරේ ස්වභාවය | තනතුර | අදාළ වන සේවය | වැටුප් ක්‍රමය | අනුමත මුළු තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 1 | 0 |
| | අතිරේක විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | SLAS (Special) | SL-3-2016 | 1 | 0 | 1 |
| | වෛද්‍ය නිලධාරී | Primary Grade | SL-2-2016 | 1 | 0 | 1 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ | SLAS (Class I) | SL-1-2016 | 4 | 3 | 1 |
| | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ප්‍රධාන අභ්‍යන්තර විගණක | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLAS(Class II or III) | SL-1-2016 | 10 | 9 | 1 |
| | ගණකාධිකාරී | SLAcS(Class I) | SL-1-2016 | 1 | 1 | 0 |
| | ගණකාධිකාරී | SLAcS(Class II or III) | SL-1-2016 | 9 | 6 | 3 |
| | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | SLITS(Class II or III) | SL-1-2016 | 1 | 0 | 1 |
| | නීති නිලධාරී | Dept | SL-1-2016 | 1 | 0 | 1 |
| | Software Developer | Dept | Contract | 3 | 2 | 1 |
| | | | | **34** | **24** | **10** |
| තෘතීය මට්ටම | පරිපාලන නිලධාරී | PMAS (Supra) | MN-7-2016 | 4 | 1 | 3 |
| | භාෂා පරිවර්තක සිංහල - ඉංග්‍රීසි 01<br>සිංහල - දෙමළ 01 | TS | MN-6-2016 | 2 | 2* | 0 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | SLICTS | MN-6-2016 | 5 | 2 | 3 |
| | | | | **11** | **5** | **6** |
| ද්විතීය මට්ටම | කාර්මික නිලධාරී | SLTS | MN-3-2016 | 1 | 0 | 1 |
| | අයවැය සහකාර | RS | MN-4-2016 | 1 | 1 | 0 |
| | විශ්‍රාම වැටුප් නිලධාරී | Dept. | MN-4-2016 | 340 | 244 | 96 |
| | සංවර්ධන නිලධාරී | DOS | MN-4-2016 | 398 | 395 | 3 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | PMAS | MN-2-2016 | 190 | 178 | 12 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | SLICTS | MT-1-2016 | 5 | 2 | 3 |
| | ලේඛණ සහකාර | Dept. | MN-1-2016 | 141 | 123 | 18 |
| | Help Desk Operator | Dept. | Contract | 2 | 0 | 2 |
| | | | | **1078** | **943** | **135** |
| ප්‍රාථමික මට්ටම | බංගලා භාරකරු | Dept. | PL-1-2016 | 2 | 1 | 1 |
| | අරක්කැමි / උද්‍යාන කම්කරු | Dept. | PL-1-2016 | 4 | 3 | 1 |
| | රියදුරු | DS | PL-3-2016 | 12 | 10 | 2 |
| | විදුලි කාර්මික | Dept. | PL-3-2016 | 1 | 0 | 1 |
| | කාර්යාල කාර්ය සහායක | OES | PL-1-2016 | 56 | 43 | 13 |
| | | | | **75** | **57** | **18** |
| **එකතුව** | | | | **1198** | **1029** | **169** |

*භාෂා පරිවර්තක - සේවයේ නියුතු සේවක සංඛ්‍යාව :- සිංහල - ඉංග්‍රීසි - 01
ඉංග්‍රීසි - දෙමළ - 01

## 02. දෙපාර්තමේන්තු ක්‍රියාවලිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සමස්ථ කාර්යභාරය ලියාපදිංචිය, ගෙවීම් නියාමනය, ලැබීම් නියාමනය හා සංවර්ධන ප්‍රවේශය යන ක්‍රියාවලි 4 ක් ඔස්සේ සිදුවන අතර මෙම ක්‍රියාවලි පවත්වා ගැනීමේ පහසුව සැලසෙන පරිදි විවිධ අංශයන් ඔස්සේ පරිපාලනය කරනු ලබයි.

### 02. 1. ලියාපදිංචිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ප්‍රතිලාභ හිමිකර ගන්නා සියලු ප්‍රතිලාභීන් ලියාපදිංචි කර අනන්‍යතාව තහවුරු වන පරිදි විධිමත් ලෙස ගෙවීම් හා අයකිරීම් සිදු කිරීම සඳහා අදාල තොරතුරු දත්ත පද්ධතියට ඇතුලත් කිරීම හා විශ්‍රාම වැටුප් අංක ලබාදීම ඇතුළු අවශ්‍ය මූලික පියවරයන් ගනු ලබන්නේ ලියාපදිංචි ක්‍රියාවලිය ඔස්සේය.

දිවයින පුරා සියලු රාජ්‍ය සේවකයින් හා සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා කාලය අවසන් වීමෙන් විශ්‍රාම ලැබීම සඳහා ලියාපදිංචි වීම මෙන්ම සංශෝධිත විශ්‍රාම වැටුප්, විශේෂ වන්දි සහ වන්දි විශ්‍රාම වැටුප් සඳහා වන ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය මාර්ගගතව ලියාපදිංචි අංශයෙන් සිදු කෙරේ.

සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවයේ යෙදී සිටියදී සිදුවන මිය යාමකදී උරුමකරුවන් වෙත ගෙවන මරණ පාරිතෝෂික ප්‍රතිලාභය සඳහා ලියාපදිංචි කිරීම සිදු වන්නේ ද ලියාපදිංචි අංශය මඟිනි.

එමෙන්ම පිරිවෙන් ගුරු, පෞද්ගලික පාසල් ගුරු, 2006.01.02 දිනට පෙර විශ්‍රාම ලැබූවන්, අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ලබන්නන්, විනය හේතුන් මත විශ්‍රාම ගැන්වූවන් යන විමධ්‍යගත නොකළ කාණ්ඩයේ විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය සඳහා ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර පරීක්ෂා කිරීම හා අදාල කාර්යයන් ගණන් බැලීම් අංශය මගින් සිදු කෙරේ.

එමෙන්ම සියලුම රාජ්‍ය සේවකයන් රාජ්‍ය සේවයට ඇතුළත් වීමත් සමඟම වැන්දඹු හා අනත්දරු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ ලියාපදිංචි වීම අනිවාර්ය කාර්යයකි. මාර්ගගත දත්ත පද්ධතියක් ඔස්සේ අදාල රාජ්‍ය නිලධාරියා සේවය කරන ආයතනය මගින් විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතියට පිවිස වැන්දඹු හා අනත්දරු අංක ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ඇත. එමෙන්ම රාජ්‍ය සේවකයකුගේ හෝ විශ්‍රාමිකයකුගේ අභාවයකින් අනතුරුව වැන්දඹු හෝ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ද, රාජ්‍ය සේවයේ යෙදී සිටියදී මියයන රාජ්‍ය සේවකයන් සහ ත්‍රස්තවාදී හේතුන් මත මියයන රාජ්‍ය සේවකයන් යන අයවලුන් සඳහා මරණ පාරිතෝෂික අංක ලබාදීමේ ක්‍රියාවලියද සිදුවන්නේ වැන්දඹු අනත්දරු අංශය මඟිනි.

වසර 1942 අංක 18 දරණ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥා පනතින් ආවරණය වන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් රහිත පත්වීම් දරන්නන් වෙත සේවා අවසාන ප්‍රතිලාභ තහවුරු කිරීම සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ලියාපදිංචිය රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මගින් සිදු කෙරේ.

### 02. 2. ගෙවීම් නියාමනය.

විශ්‍රාම වැටුප්, වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ආදී මාසිකව සිදු කරන ගෙවීම් ද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම්, වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගෙවීම්, මරණ පාරිතෝෂික ගෙවීම් වැනි එක්වරක් පමණක් සිදු කරන ගෙවීම් ද නිරවද්‍යතාවයෙන් යුතුව නියාමනය කිරීම ගෙවීම් නියාමනය යටතේ සිදු කෙරේ.

විශ්‍රාමිකයා වෙත විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සහතික කිරීම "සත්කාර පියස" සම්මුඛ පරීක්ෂණය මගින් සිදු කරනු ලබන අතර ලියාපදිංචි අංශයේ අධීක්ෂණය යටතේ මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ වේ. විශ්‍රාමිකයා පදිංචි ග්‍රාම නිලධාරී කොට්ඨාශයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත විශ්‍රාමිකයාගේ විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රය අදාල ආයතනය විසින් නිකුත් කෙරෙන අතර, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට එය ඇතුළත් කර සනාථ කිරීම සිදුවේ. එසේ සනාථ නොවන අවස්ථාවලදී

එනම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් අදාල විශ්‍රාමිකයාගේ තොරතුරු තහවුරු කර නොගත් අවස්ථා වලදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණන අංශය මගින් දත්ත පද්ධතිය පරීක්ෂා කර එකී විශ්‍රාම වැටුප් ගෙවීම් නතර කිරීමට කටයුතු කරනු ලැබේ.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම ද උක්ත ගෙවීම් ක්‍රියාවලිය අනුව සිදුවන අතර මාසික ගෙවීම් අංශය විසින් අදාල ගෙවීම් මාසිකව සිදු කරනු ලැබේ.

එමෙන්ම විදේශගත විශ්‍රාමිකයින්ගේ හෝ විශ්‍රාම වැටුප් ගණනය කිරීම් විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් සිදුවන අතර මාසික ගෙවීම් අංශය විසින් අදාල ගෙවීම් නියාමනය සිදු වේ. මෙකී සියලුම මාසික ගෙවීම් විශ්‍රාමිකයින්ගේ පෞද්ගලික ගිණුම් වෙත සෘජුව බැර කිරීම සිදු වේ.

එක්වරක් පමණක් සිදුකරන ගෙවීම් අතරින් විශ්‍රාම පාරිතෝෂික ගෙවීම, පාරිතෝෂික ගෙවීම් අංශය මගින් සිදු කරනු ලබන අතර විශ්‍රාමිකයාගෙන් රජයට අයවිය යුතු අයවීම් ඇතොත් එකී අයවීම් අයකිරීම සිදුකර ඉතිරි මුදල් විශ්‍රාමිකයාගේ ගිණුමට බැර කිරීම එහිදී සිදු වේ. එමෙන්ම මරණ පාරිතෝෂික ගෙවීම් සඳහා වන කාර්යභාරය වැන්දඹු හා අනත්දරු අංශයෙන් සිදුකරනු ලැබේ.

විශ්‍රාම වැටුප් හිමිකම නොලබා සේවයෙන් ඉවත්වන සන්නද්ධ සේවා නිලධාරීන්ගේ සේවා පාරිතෝෂික හා සිවිල් සේවා පාරිතෝෂික සැකසීම පිළිබඳ කටයුතු ලියාපදිංචි අංශයෙන් හා ගණන් බැලීම් අංශයෙන් සිදු වේ. විශේෂ වන්දි ගෙවීම් සඳහා වන ගණනය කිරීම් ද ලියාපදිංචි අංශය මගින් සිදු කෙරේ. මෙම සියළු ගණනය කිරීම් වලට අදාලව කරනු ලබන ගෙවීම් නිසි අධීක්ෂණයක් හා කළමනාකාරිත්වයක් යටතේ විනිවිදභාවයකින් යුතුව සිදු කිරීම ගිණුම් අංශයේ ප්‍රමුඛ කාර්යභාරය වේ.

වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම් ක්‍රියාවලිය වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම් අංශය මගින් ද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගෙවීම රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය මගින් ද සිදුවන අතර වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කරනු ලබන ප්‍රතිපාදන දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා යොදා ගැනීම සම්බන්ධ ගිණුම් පවත්වා ගැනීම ගිණුම් අංශයේ කාර්යභාරය වේ.

### 02. 3. ලැබීම් නියාමනය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාවලි අතර ලැබීම් නියාමනය ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර මෙම කාර්යය වැන්දඹු හා අනත්දරු අරමුදල් ලැබීම් නියාමනය, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් නියාමනය හා ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම් නියාමනය ලෙස කාණ්ඩ තුනක් ඔස්සේ විග්‍රහ කළ හැකිය.

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් පනත, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත සහ වැන්දඹු හා අනත්දරු අරමුදල් සන්නද්ධ සේවා පනත යන පනත් ප්‍රකාරව අදාල දායකයන්ගේ දායක මුදල් අයකර ගැනීම සිදු වේ. එහිදී ප්‍රාථමික මට්ටමේ සහ ද්විතීක මට්ටමේ නිලධාරීන්ගේ මූලික වැටුපෙන් 6% ක් ද තෘතීක මට්ටමේ හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගෙන් 7% ක් ද වැන්දඹු හා අනත්දරු දායක මුදලට බැර කිරීම සිදුවේ. මධ්‍යම රජයේ ආයතන හර සටහන් මගින් සෘජුවම මහා භාණ්ඩාගාරයේ ඒකාබද්ධ අරමුදලට අදාල අරමුදල් බැර කිරීම සිදු කරන අතර පළාත් සභා හා පළාත් පාලන ආයතන විසින් චෙක්පත් මගින් අදාල අරමුදල් ගෙවීම සිදු වේ. වැන්දඹු හා අනත්දරු අරමුදල් ආපසු ගෙවීම සඳහා මෙම මුදල් භාවිතා වන අතර වැන්දඹු හා අනත්දරු අංශය විසින් අදාළ ලැබීම් නියාමනය සිදු කරනු ලැබේ.

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබූ නිලධාරීන්ගේ වැටුපෙන් අයවන 8% ක දායක මුදලත්, සාමාජිකයා සේවය කරන ආයතනය විසින් ගෙවනු ලබන 12% ක දායක මුදලත් රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදල වෙත බැර වේ. අරමුදල් ආපසු ගෙවීම සඳහා අවශ්‍ය මුදල් හැර අනෙක් සියලු මුදල් භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කරනු ලබන අතර එයින් ලැබෙන පොලී අනුපාතයන් ද සාමාජිකයන් වෙත ප්‍රතිලාභ ලෙස ලබාදීම සිදු වේ. මෙකී රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම්

නියාමනය කිරීම සිදු වන්නේ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය විසිනි.

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ලැබීම්වල තුන්වැනි කාණ්ඩය වන්නේ ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන ආදායම්ය. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ලේ දෙපාර්තමේන්තුව ප්‍රයෝජනයට නොගන්නා ඉඩ ප්‍රමාණයන් වෙනත් ආයතන වෙත කුලී පදනම මත ලබාදී ඇති අතර එමගින් මාසිකව ආදායම් රැස් කිරීම සිදු කරනු ලැබේ.

එමෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් විශ්‍රාමික ප්‍රජාව ඇතුළු සමස්ත මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා පවත්වාගෙන යනු ලබන නිවාඩු නිකේතනවලින් ද මාසිකව ආදායම් උපයනු ලැබේ. හෙක්ටයාර 3.0575 ක භූමි භාගයක පිහිටා ඇති කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයෙන් නිවාස, කාමර පහසුකම්, දේශන ශාලා පහසුකම් සහ භෝජනාගාර පහසුකම් සහන මිලක් යටතේ ලබාදෙනු ලැබේ. හෙක්ටයාර 0.1427 ක භූමි භාගයක පිහිටි රම්බොඩ නිවාඩු නිකේතනය ද විශ්‍රාමික ප්‍රජාව මෙන්ම දේශීය හා විදේශීය සංචාරකයින් වෙත නවාතැන් පහසුකම් සපයනු ලබන අතර එමගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ආදායම් රැස්වේ. එකී ගොඩනැගිලි කුලී සහ නිවාඩු නිකේතන මගින් ලැබෙන ආදායම් නියාමනය කරනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ පාලන අංශය විසිනි.

### 02. 4. සංවර්ධන ප්‍රවේශය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු සංවර්ධන ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් මානව සම්පත් සංවර්ධනය, තොරතුරු තාක්ෂණික සංවර්ධනය, විෂය සංවර්ධනය හා භෞතික සම්පත් සංවර්ධනය යන සිව් වැදෑරුම් මානයන් ඔස්සේ විග්‍රහ කළ හැකි ය.

දෙපාර්තමේන්තුව සතු ප්‍රධානතම සම්පත වන මානව සම්පත සංවර්ධනය කිරීම උදෙසා පාලන හා සුබසාධන අංශය මගින් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සිදුවේ. එහිදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමේ හා නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන කිරීමේ විෂය මූලික වැඩසටහන් ද ආකල්ප හා කුසලතා සංවර්ධන වැඩසටහන් ද අභ්‍යන්තර පුහුණු හා බාහිර පුහුණු වැඩසටහන් වශයෙන් සංවිධානය කෙරේ. මෙහිදී විවිධ සම්පත් දායකයන් හා ආයතන සම්බන්ධ කරගෙන මෙකී පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුගත මානව සම්පත, සම්පත්දායකයන් ලෙස යොදා ගනිමින් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව වෙනත් ආයතන දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමද මෙම අංශයේ විෂය පථය යටතේ සිදු කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණය අතින් ලෝකයේ විවිධ ක්ෂේත්‍රයන් සීඝ්‍ර වේගයකින් ගමන් ගන්නා ඉදිරි ගමනට සමගාමීව යාවත්කාලීන වෙමින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය ද ලෝකයේ තොරතුරු තාක්ෂණික නව ගමන්මග සමග යාවත්කාලීන කරමින් නව අත්හදාබැලීම් ඇසුරින් නවීන ක්‍රමෝපායන් හඳුන්වාදීම දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය මගින් සිදු කෙරේ. මාර්ගගත දත්ත පද්ධති හඳුන්වාදීම මෙන්ම ඒවා යාවත්කාලීන කිරීම ද, නිල වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වාගෙන යාමද තොරතුරු තාක්ෂණ අංශයේ සෘජු නියාමනය සමග සිදු කෙරේ.

තොරතුරු තාක්ෂණික සංවර්ධනය සමග තොරතුරු සන්නිවේදන කටයුතු නවීන තාක්ෂණික උපක්‍රම ඔස්සේ සිදුකිරීම දෙපාර්තමේන්තු මාධ්‍ය ඒකකය මගින් සිදුවේ. එහිදී නිල වෙබ් අඩවිය, නිල Facebook පිටුව, නිල youtube චැනලය, වෙබ් සඟරාව හා විශ්‍රාම රේඩියෝව යන මාධ්‍යන් ඔස්සේ තොරතුරු යාවත්කාලීන කිරීම ද බාහිර මාධ්‍ය ආයතන වෙත තොරතුරු ලබාදීම ද මාධ්‍ය ඒකකය මගින් සිදු කෙරේ.

විශ්‍රාම වැටුප් විෂය, පවතින සමාජයීය තත්ත්වයන් යටතේ යාවත්කාලීන කිරීම හා විෂය මූලිකව පවතින ගැටලු නිරාකරණය කිරීම සිදුවන්නේ ප්‍රතිපත්ති හා නීති අංශය මගිනි. එහිදී විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, නව චක්‍රලේඛ නිකුත් කිරීම හා ප්‍රතිපත්තිමය ගැටළු විසඳීම, විශ්‍රාම වැටුප් සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග සඳහා ක්‍රියාත්මක වීම යන විෂය සංවර්ධන ක්‍රියාවලි දියත් කිරීම ප්‍රතිපත්ති හා නීති අංශය මගින් සිදු කෙරේ.

එමෙන්ම දෙපාර්තමේන්තුව තුළ කාර්ය මණ්ඩලය සඳහා මෙන්ම සේවාලාභී විශ්‍රාමික ප්‍රජාව සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් විවිධාකාරයේ භෞතික සංවර්ධනයන් ක්‍රියාත්මක කිරීම පාලන හා සුබසාධන අංශය මගින් සිදු කෙරේ. එහිදී දෙපාර්තමේන්තු අභ්‍යන්තර පරිසරය හා බාහිර පරිසරය යන ද්විත්වයම සංවර්ධනය කිරීම හා නිසි පරිදි නඩත්තු කිරීම සිදු කෙරේ.

### 02.5. පසු විපරම

සමාලෝචන වර්ෂය තුළ දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණනයට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක සිවිල්, වැන්දඹු හා හමුදා විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂණයන් සිදු කර ඇත. එමගින් 2018 වර්ෂයට පෙර සිට ගෙවනු ලබන ජීවන වියදම් දීමනා, අන්තර් දීමනා, මූලික වැටුප් හා වැටුප් පරිවර්තන කිරීමේදී වරින් වර විවිධ පාර්ශවයන් සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන් මත නැවත ගණනය කිරීම් වලදී විශ්‍රාමිකයන්ට වැඩිපුර ගෙවා තිබූ රුපියල් මිලියන 48ක මුදල් ප්‍රමාණයක් අනාවරණය කර ගැනීමට හැකිවී තිබේ. එසේ අනාවරණය වූ අධි ගෙවීම් නිවැරදි කිරීමට හා අය කර ගැනීමට කටයුතු කිරීම තුළින් රාජ්‍ය අරමුදල් පිළිබඳ දෙපාර්තමේන්තු වගකීම නිසි පරිදි ඉටු කිරීමට හැකියාව ලැබී තිබේ.

වැඩිපුර ගෙවනු ලැබූ ගෙවීම් අනාවරණය වූ පසු, නිවැරදි කිරීමට කටයුතු කිරීම තුළින්, වාර්ෂිකව සිදුවන වැඩිපුර ගෙවනු ලැබ ඇති විශ්‍රාම වැටුප් ප්‍රමාණයන් අඩුකර ගැනීමට හැකිවී ඇත. මීට අමතරව විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි හා පෙත්සම් සම්බන්ධයෙන් ද කරනු ලබන විශේෂ විගණන පරීක්ෂණ තුළින් තොරතුරු නිසි පරිදි ඉදිරිපත් නොවීම හෝ වසන් කිරීම නිසා සිදු වූ වැඩිපුර හා සුදුසුකම් නොලත් ගෙවීම් වළක්වා ගැනීමට ද, එම මුදල් අයකර ගැනීමට ද හැකියාව ලැබී තිබේ.

සමාලෝචන වර්ෂය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම හා දෙපාර්තමේන්තුවේ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් කරන ලද විගණන පරීක්ෂණයන්හිදී විගණන විමසුම් 44ක් ඉදිරිපත් කර ඇත. මෙම විගණන විමසුම් 44න් වර්ෂය තුළ විගණන විමසුම් 37ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ඉදිරිපත් කර ඇති අතර තවදුරටත් විගණන විමසුම් 7ක් සඳහා පිළිතුරු සකස්කර ඉදිරිපත් කල යුතුව තිබිණි.

## 03. වාර්ෂික වැඩසටහන්

### 03. 1. ජාතික විශ්‍රාමික දින සැමරුම

ශ්‍රී ලාංකික විශ්‍රාමික ප්‍රජාව රාජ්‍ය සේවය වෙනුවෙන් කරනු ලැබූ සුවිශේෂී කැපවීම අභිමානයෙන් සිහිපත් කරමින් සෑම වසරකම ඔක්තෝම්බර් 08 වැනි දිනට යෙදුණු "ජාතික විශ්‍රාමික දිනය" 2018 වසරේදී ද උත්කර්ෂවත් ලෙස සැමරීමට අවශ්‍ය කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබිණි. දිවයිනේ සියලුම විශ්‍රාමික ප්‍රජාව නියෝජනය වන පරිදි පළාත් නවය නියෝජනය කරමින් කළුතර, මහනුවර, අම්පාර, රත්නපුර, යාපනය, පොළොන්නරුව, පුත්තලම, මාතර සහ බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සම්බන්ධීකරණයෙන් අදාල සැමරුම් උත්සව සංවිධානය කරනු ලැබීය.

විශ්‍රාමික ප්‍රජාව වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියෙන් ඔබ්බට සමාජ, ආර්ථික සුරක්ෂිතභාවය වෙනුවෙන් ජාතික මට්ටමේ කතිකාවක් ගොඩනැංවීම අරමුණු කර ගනිමින් මෙවර ජාතික විශ්‍රාමික දිනය සංවිධානය වූයේ "දිවියට නව අරුණක් " යන සුවිශේෂී තේමාවෙනි.



ඒ ඒ පළාත් සඳහා විශේෂ වන අයුරින් විද්වත් දේශන, වැඩමුළු, සෞඛ්‍ය කඳවුරු ආදී සුබසාධන සේවාවන් රැසක් විශ්‍රාමිකයන් වෙනුවෙන් සංවිධානය වී තිබූ අතර විශ්‍රාමික දින උළෙලට සහභාගි විය නොහැකි ශාරීරික අපහසුතාවයන්ගෙන් යුතු ජ්‍යෙෂ්ඨ විශ්‍රාමික ප්‍රජාවට ගෞරව දැක්වීම සඳහා ඔවුන්ගේ නිවෙස් වෙතම ගොස් ප්‍රණාම දැක්වීම ද ප්‍රාදේශීය මට්ටමින් දිස්ත්‍රික්ක කිහිපයකදී සිදු කිරීම මෙවර උළෙලේ විශේෂත්වයක් විය.

නිර්මාණශීලී කලා කෞශල්‍යයන් එළි දක්වමින් විශ්‍රාමිකයන් විසින් ඉදිරිපත් කරනු ලැබූ වින්දනාත්මක වැඩසටහන් වලින් වර්ණවත් වූ සැමරුම් උත්සව සංවිධානය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් ඇතුළු දිස්ත්‍රික් කාර්යාලයන්හි නිලධාරීන්ගේ මා හැඟි දායකත්වය නොමඳව ලැබුණි. එමෙන්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන වල මූල්‍ය අනුග්‍රහය මත ත්‍යාග සහ ප්‍රතිලාභ ලබා දෙමින් ජාතික විශ්‍රාමික දිනය ස්මරණීය දිනයක් බවට පත් කිරීමට නොමසුරු දායකත්වය ලබා දුන්හ.



### 03. 2. තාක්ෂණ සැසිය

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් ජාතික විශ්‍රාමික දිනයට සමගාමීව දෙවන වරටත් අති සාර්ථකව සංවිධානය කරනු ලැබූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු “තාක්ෂණ සැසිය - 2018 ”, 2018.10.26 වන දින බත්තරමුල්ල වෝටර්ස් ඒජ්හි දී පැවැත්විණි.




රාජ්‍ය සේවයේ සියලුම රාජ්‍ය ආයතනයන් සමග සහසම්බන්ධතාවයක් ඇති ප්‍රමුඛ පෙළේ දෙපාර්තමේන්තුවක් වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ගෙවීම් ක්‍රියාවලියෙහි සහ මධ්‍යගත දත්ත පද්ධතිය ආශ්‍රිතව සිදු කෙරුණු නවීන වෙනස්කම් සහ යාවත්කාලීන වීම් පිළිබඳ අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි ඉහළ පරිපාලනය දැනුවත් කිරීමේ අරමුණින් තාක්ෂණ සැසිය - 2018 සංවිධානය කරනු ලැබිණි.

විශ්‍රාම වැටුප් ගෙවීම් පද්ධතිය ආශ්‍රිතව තවදුරටත් සිදුවිය යුතු යාවත්කාලීන වීම් සහ වැඩිදියුණු වීම් පිළිබඳ රජයේ ඉහළ නිලධාරීන්ගේ යෝජනා හා අදහස් ලබා ගැනීමේ විද්වත් කතිකාවක් ලෙස තාක්ෂණ සැසිය - 2018 සංවිධානය කරනු ලැබුවේ “Sustainable Digitization of Pension Services” යන තේමාව පෙරදැරිවය. මෙම අවස්ථාවෙහි ප්‍රධාන දේශනය මහාචාර්ය එච්.ඩී.කරුණාරත්න මහතා විසින් පැවැත්වූ අතර ජපානය මූලික කර ගනිමින් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැන්වෙන රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදයන්හි අන්තර්ජාතික ප්‍රවණතා පිළිබඳවත් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු ශ්‍රී ලාංකික විශ්‍රාම වැටුප් ක්‍රියාවලියෙහි ඇතිවිය යුතු නව ප්‍රවණතාවයන් පිළිබඳවත් සාකච්ඡාවට ලක් කරන ලදී. විගණන කොමිසමේ සභාපති සහ විගණකාධිපති එච්.එම්.ගාමිණී විජේසිංහ මහතා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු තාක්ෂණ සැසියෙහි විශේෂ දේශනයක් පවත්වමින් විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගවීම පිළිබඳව අවධාරණය කරන ලදී. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි නිල වෙබ් අඩවිය අන්තර්ජාලයට මුදා හැරීම විදෙස් විශ්‍රාම වැටුප් ක්‍රමය මාර්ගගත කිරීම, පොදු 55 ආකෘති පත්‍රය මාර්ගගත කිරීම, හැඳුනුම්පත් පිටපත් කිරීමේ නව මුද්‍රණ යන්ත්‍රය හඳුන්වාදීම ආදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් විශ්‍රාමික ප්‍රජාව වෙත සැලසෙන නවතම සේවාවන් දියත් කිරීම ද තාක්ෂණ සැසියට සමගාමීව සිදු කරනු ලැබිණි.

ගරු රාජ්‍ය පරිපාලන අමාත්‍ය රංජිත් මද්දුමබණ්ඩාර මැතිතුමා හා අමාත්‍යාංශ ලේකම් පද්මසිරි ජයමාන්න මහතා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් ආදී රජයේ ඉහළ නිලධාරීන් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හා නිරන්තරයෙන් සම්බන්ධ වන පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් ද මෙම අවස්ථාවට සහභාගි විය.



### 03. 3. අභ්‍යන්තර පුහුණු සහ විදෙස් පුහුණු අවස්ථා කළමනාකරණය

දිවයින පුරා වෙසෙන ලක්ෂ හයකට අධික විශ්‍රාමික ප්‍රජාව වෙත මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය නිරවද්‍යතාවයෙන් සහ ගුණාත්මකභාවයෙන් යුතුව කාර්යක්ෂම සේවාවක් ලෙස පවත්වා ගැනීම උදෙසා සක්‍රීය කාර්යභාරයක දෙපාර්තමේන්තුවේ ඉහළ සිට පහළ දක්වා විහිදුණු ධූරාවලියෙහි සෑම නිලධාරියෙකුම නිරත වේ. එම නිසා මානව සම්පත ආයතනය සතු වටිනාම සම්පත ලෙස සළකන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විවිධ පුහුණු වැඩසටහන් කළමනාකරණය කරමින් සිය නිලධාරීන් සතු දැනුම සහ ශක්‍යතාවන් වැඩිදියුණු කිරීමට ක්‍රියාකරනු ලබයි. 2018 වසරේදී දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් බහුතරයක් විවිධ පුහුණු අවස්ථාවන් සඳහා යොමු වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

2018 වසරේ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට එක් වී දෙපාර්තමේන්තුවට පැමිණි නවක නිලධාරීන් 53 දෙනෙකු වෙත 2018.05.15 සිට 2018.06.01 දක්වා සති දෙකක කාල සීමාවක් සේවාරම්භක පුහුණුවක් ලබා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදී. 2018.07.07 සිට 2018.07.22 දක්වා සති අන්ත දිනවලදී ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් සඳහා දෙමළ භාෂා පුහුණුවක් ද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට පත්වීම් ලැබ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරනු ලැබූ දෙවන කණ්ඩායමෙහි නිලධාරීන් 18 දෙනෙකු වෙත 2018.10.19 සිට 2018.11.02 දක්වා සති දෙකක සේවාරම්භක පුහුණුවක් ලබා දීමට ද කටයුතු කෙරිණි. කාර්යාල ක්‍රම ආයතන සංග්‍රහය සහ මහජන සම්බන්ධතාවය පිළිබඳ දෙපාර්තමේන්තුවේ ද්විතීයික මට්ටමේ නිලධාරීන් සතු දැනුම සහ ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් වැඩමුළුවක් 2018.12.08 හා 2018.12.09 දෙදින කැළණිය වෙදමුල්ල විශ්‍රාමික නිවාඩු නිකේතනයේ දී පවත්වනු ලැබිණි. ඒ සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් 93 දෙනෙකු සහභාගී විය. 2018.12.14 හා 2018.12.15 යන දෙදින බැහැරගත පුහුණු වැඩසටහනක් (Outbound Training) සංවිධානය කරමින් නිලධාරීන් හට නායකත්ව පුහුණුව සහ පෞරුෂ සංවර්ධනය සඳහා විශේෂ ක්‍රියාකාරකම්වල යෙදීමේ අවස්ථාව ලබා දීමට පියවර ගන්නා ලදී. නිලධාරීන් 89 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එම විශේෂ වැඩසටහන් සඳහා යොමු කරනු ලැබිණි.



දේපළ / උපකරණ සබැඳිව ස්ථාවර වත්කම් පවත්වා ගෙන යාම පිළිබඳව නිපුණතා සංවර්ධන අධිකාරිය මගින් 2018.07.17 වන දින පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන සඳහා ද දෙපාර්තමේන්තු නිලධාරීන් කණ්ඩායමක් සහභාගී විය. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් ගැටුම් කළමනාකරණය හා දුක් ගැනවිලි හැසිරවීම සම්බන්ධව රාජ්‍ය නිලධාරීන් වෙත ලබා දුන් පුහුණු අවස්ථාව සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් මාණ්ඩලික නිලධාරිනියක සහභාගී කරවනු ලැබුණි. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මගින් රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම, රියදුරන්ගේ කුසලතා වර්ධනය සහ සහායක කාර්යාල මණ්ඩල සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය යන තේමාවන් යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී කෙරිණි. Academy of Financial Studies ආයතනය මගින් පැවැත්වූ විනය ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණු වැඩසටහන ආදී වැඩසටහන් රාශියක් සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් සහභාගී කරවමින් නවමු අත්දැකීම් ඔස්සේ නිලධාරීන්ගේ ආකල්ප සහ කුසලතා සංවර්ධනය කිරීමට 2018 වසරේදී ද දෙපාර්තමේන්තුවේ උපරිම දායකත්වය සැපයීමට ක්‍රියාකරන ලදී.



රාජ්‍ය ආයතන අතර ඉහළ ගුණාත්මක සේවාවක් සපයනු ලබන රාජ්‍ය ආයතනයක් වූ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය අන්තර්ජාතික ප්‍රමිතියෙන් යුතුව පවත්වා ගැනීම සඳහා ජාත්‍යන්තර සමාජාරක්ෂණ ක්‍රියාවලීන් පිළිබඳ නිබඳවම අවධානය යොමු කරන දෙපාර්තමේන්තුවක් වේ. දෙපාර්තමේන්තුව වෙත පිරිනැමෙන වාර්ෂික විදේශ පුහුණු අවස්ථා එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකරණය කරමින් 2018 වසරේ දී විදෙස් පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කරනු ලැබීය. 2018.03.25 සිට 2018.04.02 දක්වා තායිලන්තයේ පැවැත්වුණු කළමනාකරණය පිළිබඳ PMI ජාත්‍යන්තර වැඩසටහන සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහභාගි කෙරුණු අතර 2018.04.25 හා 2018.04.26 දෙදින ජපානයේ පැවැත්වුණු රක්ෂණය සහ ආසියාවේ විශ්‍රාම ඉතිරිය සම්බන්ධ ADBI-JFSA-OECD හමුව සඳහා ද දෙපාර්තමේන්තු නිලධාරියකු සහභාගි කෙරුණේද ඒ අනුවයි. තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කිරීම උදෙසා වන මූල්‍ය සමාජ ආරක්ෂණය ශක්තිමත් කිරීම යන මැයෙන් 2018.05.15 සිට ජපානයේ පැවැත්වුනු සමුළුවට සහභාගි වීමට අවස්ථාව ලබාදීම ද දෙපාර්තමේන්තුව වෙත හිමිවුණු විශේෂ විදෙස් පුහුණු අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. ඉන්දියානු රාජ්‍ය අංශය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා 2018.07.30 සිට 2018.08.03 දක්වා පැවති සංචාරය සඳහා ද දෙපාර්තමේන්තුව නියෝජනය කළ අතර 2018.08.22 දින ජපානයේ පැවති පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි සඳහා වන පුහුණු වැඩසටහන සඳහා ද දෙපාර්තමේන්තුව නියෝජනය කරන ලදී. 2018.10.22 සිට 2018.10.26 දක්වා ඉන්දියාවේ පැවති රාජ්‍ය පරිපාලන සහ සංවර්ධන වැඩසටහන සඳහාත් එම තේමාවෙන්ම 2018.11.26 සිට 2018.11.30 දක්වා ඉන්දියාවේ පැවති පුහුණු වැඩසටහන සඳහාත් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවනු ලැබීය.

### 03.4. දැනුම් කළමනාකරණය

විශ්‍රාම වැටුප් ලියාපදිංචිය මාර්ගගත කිරීම පිළිබඳව සහ වැන්දඹු හා අනත්දරු නැවත ලියාපදිංචි කිරීම පිළිබඳව වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අයදුම්පත් මාර්ගගතව යොමු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා විශ්‍රාම වැටුප් කළමනාකරණ පද්ධතිය හා සහසම්බන්ධව කටයුතු කරන 3000 කට අධික රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම, පුහුණු කිරීම සඳහා සම්පත් දායකයින් ලබා දෙමින් ඔවුන් කාර්යක්ෂමව තොරතුරු පද්ධතිය හා යා කර ගැනිණි.

මධ්‍යම රජයේ මෙන්ම පළාත් සභා, පළාත් පාලන ආයතනවලද නිලධාරීන් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහන් 19 ක් පමණ වර්ෂය මුළුල්ලේම පවත්වා ඇත.

එමෙන්ම විශ්‍රාම වැටුප් ක්‍රියාවලියේ නවීකරණයන් හඳුන්වාදීම සඳහා දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන ගණකාධිකාරීවරුන් පුහුණු කිරීම සඳහා 2018 වර්ෂය තුළ පුහුණු වැඩසටහන් 03ක් පවත්වා ඇත. එසේම ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, ශ්‍රී ලංකා පදනම් ආයතනය වැනි රාජ්‍ය සේවක පුහුණුකිරීමේ ආයතන සඳහා විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු කිරීමට වරින් වර සම්පත් දායකයින් ලබාදීම සිදුකර ඇත.

පුහුණු වැඩමුළු පැවැත්වීමට අමතරව දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය ඔස්සේ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රදර්ශනය කිරීම මගින් ද මාර්ගගත ලියාපදිංචි කිරීම පිළිබඳ ගැටළු සඳහා රාජ්‍ය නිලධාරීන්ට ක්ෂණික විසඳුම් ලබාදීම මගින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණය මත පදනම්ව කරනු ලැබූ නවීන හඳුන්වාදීම්

පිළිබඳව අනෙකුත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීමට පියවර ගනු ලැබීය.

### 03. 5. බැහැරගත ක්‍රියාකාරකම්

යාන්ත්‍රික ලෙස දෛනික රාජකාරී ඉටු කරන නිලධාරීන් පිරිසක් වෙනුවට කලාවට, සාහිත්‍යයට සහ විෂය බාහිර දැනුමට සංවේදී නිලධාරීන් බිහිකිරීම මගින් ඵලදායී රාජ්‍ය සේවයක් බිහිකළ හැකිය යන අරමුණින් කටයුතු කරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරිත්වය විසින් නිලධාරීන්ගේ කලා රසවින්දනය සංවර්ධනය කිරීම සඳහා ‘Friday Forum’ නම් සංකල්පය නිර්මාණය කරනු ලැබීය.




වසර ගණනාවක් පුරා ක්‍රියාත්මක කරන ලද ‘Friday Forum’ සංකල්පය උසස් කලා රසවින්දනයක් සහිත සංවේදී නිලධාරීන් පිරිසක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ නිර්මාණය කිරීමට මෙන්ම විවිධ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන් රැසකගේ ආභාෂය ලබා දීමට ද හැකි වූ සාර්ථක සංකල්පයක් ලෙස හඳුන්වා දිය හැකිය. දෙපාර්තමේන්තුවේ සියළුම අංශ නියෝජනය වන සේ මසකට වරක් උපරිම කැපවීමකින් යුතුව සංවිධානය කරනු ලබන ‘Friday Forum’ වැඩසටහන 2018 වසරේදී අතිශය සාර්ථක ලෙස පැවැත්වීමට කටයුතු කරන ලදී.

2018.01.26 දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සංවිධානය කරනු ලැබූ වසරේ ප්‍රථම ‘Friday Forum’ අත්දැකීම වූ ‘ගී මල් විල’ සංගීතමය වැඩසටහන දෙපාර්තමේන්තුවේ ගායන කෞෂල්‍යයෙන් හෙබි නිලධාරීන් රැසකගේ දක්ෂතා එළි දැක්වීමේ අවස්ථාවක් බවට පත් විය. කායික මානසික වශයෙන් නිරෝගී දිවියකට හෙළ වෛද්‍ය විද්‍යාවේ මඟ පෙන්වීම් පිළිබඳ නිලධාරීන් දැනුවත් කරමින් ‘නිරෝගී දිවියක මග’ මැයෙන් සංවිධානය කරනු ලැබූ ‘Friday Forum’ වැඩසටහන ආයුර්වේද විශේෂඥ වෛද්‍ය ඩී.එම්.තෙන්නකෝන් මහතා විසින් මෙහෙයවනු ලැබීය. ජ්‍යොෂ්ඨ රංගධර සතිස්චන්ද්‍ර එදිරිසිංහ මහතා 2018.04.20 දින ‘Friday Forum’ තුළින් උසස් මානසික තත්ත්වයන් පවත්වා ගැනීම සඳහා සාරවත් සිතුවිලි ඇති කරගැනීමෙහිලා වැදගත්කම පිළිබඳ හරවත් දේශනයක් පවත්වනු ලැබීය. 2018.06.22 වන දින පොලිස් පරීක්ෂක මනෝජ් සමරනායක මහතා විසින් ‘ශ්‍රී ලංකාවේ ළමා අපචාර පිළිබඳ වර්තමාන තත්ත්වය’ තේමාවෙන් ද 2018.10.12 පාරම්පරික වෛද්‍ය ශ්‍යාමා ප්‍රනාන්දු මහත්මිය විසින් ‘පාරම්පරික ඔසුවෙන් නිරෝගී දිවියක්’ යන තේමාවෙන් ද ‘Friday Forum’ මෙහෙයවන ලදී. රසිකත්වය මාධ්‍ය භාවිතය හා ජීවිතය පිළිබඳ 2018.11.09 දින ‘Friday Forum’ හිදී සංවාදයට බඳුන් කෙරුණු අතර මෙහෙයවූයේ ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතා විසිනි. 2018.12.07 දින පැවැත්වූ ‘Friday Forum’ වැඩසටහන ජනගායන වාදන නෘත්‍ය අංගයන්ගෙන් යුතු ආකර්ශණීය අත්දැකීමක් බවට පත්විණි. ‘ජන සංගීතය හා බැඳුණු අපේකම’ මැයෙන් එම විශේෂ ‘Friday Forum’ වැඩසටහන මෙහෙයවූයේ ප්‍රවීන කලාකරු සහන් රන්වල මහතා ඇතුළු රන්වල පදනමේ කලාකරුවන්ගේ ප්‍රධානත්වයෙනි.



එකිනෙකට වෙනස් තේමාවන්ගෙන් යුතුව සංවිධානය කරනු ලැබූ 'Friday Forum' වැඩසටහන් සියල්ලටම දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉහල ප්‍රතිචාර හිමි වූ අතරම එමඟින් රාජකාරි දිවිය පවත්වා ගෙනයාම සඳහා විශාල ප්‍රබෝදයක් ලැබී තිබිණි.

## 04. නව හඳුන්වාදීම්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළ පවත්නා ක්‍රමවේදයන් සහ පවතින තත්ත්වයන් වැඩිදියුණු කරමින් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය තව තවත් වැඩිදියුණු කිරීම 2018 වසර තුළදී සිදුවිය.

### 04. 1. භෞතික වැඩිදියුණු කිරීම

අලුතින් විශ්‍රාම දිවියට එක් වන සියලු නිලධාරීන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන සත්කාර පියස විශ්‍රාමිකයන්ගේ කටයුතු වඩාත් පහසුවෙන් ඉටුකරදිය හැකිවන ආකාරයෙන් නවීකරණය කර ඇත.

එහිදී පිළිගැනීමේ කවුළු සඳහා නවතම ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 03 ක් ලබාදීමත් සත්කාර පියස සඳහා මේස පුටු ලබාදීම හා ලිපි ලේඛන පවත්වාගෙන යාම සඳහා කබඩ් ලබාදීමත් සිදු කරන ලදී.

නිලධාරීන්ගේ හා විශ්‍රාමිකයන්ගේ කාර්යය පහසු කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුළ මහජන බැංකු ATM යන්ත්‍රයක් ස්ථාපිත කිරීම ද මෙම කාලවකවානුව තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයකි.

නිලධාරීන්ගෙන් වඩාත් ඵලදායී සේවාවක් අපේක්ෂාවෙන් ඔවුන්ගේ රාජකාරි පරිසරය නවීකරණය කිරීමත් රජයේ විගණන අංශය, විෂමතා අංශය හා දායක මුදල් අංශය දෙපාර්තමේන්තු තුන්වන මහලේම නවීකරණය කරන ලද වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමත් සිදු කරනු ලැබිණි. තොරතුරු තාක්ෂණ අංශය හා සංවිධාන සංවර්ධන අංශය නවීකරණය කර එකී බිම් වපසරියේ ඉඩ භාවිතා කරමින් රැස්වීම් කාමරයක් නිර්මාණය කරනු ලැබූ අතර, අභ්‍යන්තර විගණන අංශය නවීකරණය කර දෙපාර්තමේන්තුව තුළ මහල් කිහිපයක කොටස් කීපයක් වශයෙන් පැවති වැන්දඹු හා අනත්දරු සහ සිවිල් ලේඛනාගාරය පස්වැනි මහලේ විධිමත් පරිදි ස්ථානගත කිරීමට ද හැකි විය.



එමෙන්ම විශ්‍රාමික සංගම් නියෝජිතයන්ට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව සමග සෘජුවම සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහා හා ඔවුන්ගේ කටයුතු පහසුවෙන් කරදීම සඳහා විශ්‍රාමික සංගම් සම්බන්ධීකරණ ඒකකය පළමු මහලේ ස්ථාපිත කරන ලදී.

තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් සිදුකරන සියළු නව හඳුන්වාදීම් වලට සරිලන පරිදි නව ස(ර්)වර් යන්ත්‍රයක් මිලදී ගැනීම ද සිදු විය.

2018 වසර තුල කැළණිය වෙදමුල්ල නිවාඩු නිකේතනයේ ආරක්ෂිත වැට හා ආවරණය නොවූ කොටස ආරක්ෂිත දැල් ආවරණයක් යොදා පිළිසකර කිරීම ද ප්‍රමුඛතාවය ලබාදී සිදු කරන ලද කාර්යයකි.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සහ දෙපාර්තමේන්තුවට පැමිණෙන සේවාලාභීන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ආරක්ෂිත කැමරා පද්ධතිය නවීකරණය කිරීම හා ගිනි ආරක්ෂක පද්ධතිය යාවත්කාලීන කිරීම ද සිදු විය.

කාර්යාලය තුළ ප්‍රසන්න වටපිටාවක් ඇති කිරීම සඳහා සහ ඉඩ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ පරිහරණයට ගත නොහැකි භාණ්ඩ විධිමත් පරිදි අපහරණය කිරීම ද සිදු විය. තවද දෙපාර්තමේන්තුව වෙත පැමිණෙන පුද්ගලයන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා Visitors Pass නිකුත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.




එමෙන්ම කාර්ය මණ්ඩලයේ නිවාඩු කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අවශ්‍යතාවයන්ට අනුව තොරතුරු ලබාගත හැකි වන ආකාරයේ පරිගණක මෘදුකාංගයක් නිර්මාණය කරමින් නිවාඩු කළමනාකරණ පද්ධතියක් අලුතින් හඳුන්වාදීමට හැකි විය. එමෙන්ම දිනපතා දෙපාර්තමේන්තුව වෙත පිටතින් පැමිණෙන පුද්ගලයින් හඳුනා ගැනීම සඳහා ඔවුන් වෙත ඉදිරිපස විමසීම් කවුළුව මගින් අවසර පත්‍රයක් ලබාදීම ආරම්භ කරන ලදී.

### 04. 2. විෂය මූලික වැඩිදියුණු කිරීම

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරය වන විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම හා සඵලදායී කිරීම උදෙසා විවිධ වූ විෂය මූලික වැඩිදියුණු කිරීම් පිළිබඳව වැඩි අවධානය යොමු කරන ලදී.

විමධ්‍යගත කළ සියළු ගෙවීම් මාර්ගගත ක්‍රමයට පරිවර්තනය කිරීම මගින් ලබාගත් ඉහළ කාර්යක්ෂමතාව විමධ්‍යගත නොවූ ගෙවීම් සම්බන්ධයෙන්ද ලබා ගැනීමෙ අභිලාශයෙන් විමධ්‍යගත නොවූ විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර ද මාර්ගගත ලෙස ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු මේ වසරේදී ආරම්භ විය.

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 09/2015 ප්‍රකාරව සිදුවූ මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලිය 2018.06.01 දින සිට විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 09/2015 (සංශෝධන III) ප්‍රකාරව මාර්ගගත ක්‍රියාවලියට පරිවර්තනය කිරීම හේතුවෙන් මෙම වසරේදී මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලියේ ක්‍රියාවලි පරිවර්තනයක් සිදු විය.

මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීමේදී විශ්‍රාමිකයන් බැංකු වලින් ණය පහසුකම් ලබා ගැනීමේදී සිදුවන වංචා අවම කර ගැනීමට හැකිවන ලෙස ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය කිරීම ද, කාර්යක්ෂමව මාසික වැටුප් ගෙවීම සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික මෙවලම් යාවත්කාලීන කිරීම ද ගිණුම්වල පවත්නා අඩුපාඩු දත්ත ඇතුළත් කිරීමේදී ඇතිවන අතපසුවීම් හේතුවෙන් බැංකු මගින් හරවා එවන මාසික විශ්‍රාම වැටුප් ප්‍රමාණය අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ද 2018 වර්ෂය තුල සිදු කරන ලදී.

එමෙන්ම සන්නද්ධ සේවා අංශය මගින් සේවා ලබාගන්නා විශ්‍රාමික ප්‍රජාව වෙනුවෙන් කාර්යක්ෂම සේවාවක් ඉටු කිරීම සඳහා ශ්‍රම විභජනය මගින් වැඩකටයුතු රාශියක් සිදු කර ගත හැකිවන පරිදි ශ්‍රම බලකාය ශක්තිමත් කරන ලදී.

එමෙන්ම ත්‍රිවිධ හමුදා විශ්‍රාම වැටුප් සඳහා Forces 01 ආකෘති පත්‍රය හඳුන්වාදී එකම විශ්‍රාමිකයා විශ්‍රාම වැටුප් වර්ග කීපයක් ලබා ගන්නේද යන්න විමසා බැලෙන අතර ඒ මගින් එකම වර්ගයේ විශ්‍රාම වැටුප් කිහිපයක් ලැබීමේ අවස්ථාව වළක්වා ගැනීමට පියවර ගනු ලැබුණි. එමගින් සිදුවිය හැකි අක්‍රමිකතා තවදුරටත් අවම වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තොරතුරු තාක්ෂණ අංශය වෙත කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීම, වෙබ් අඩවිය නවීකරණය කිරීම, පොදු 55 සහ පාරිතෝෂික නැවත ගෙවීම සඳහා නව පද්ධතියක් හඳුන්වාදීම ද සිදු විය.

විශ්‍රාමික ප්‍රජාවගේ විශ්‍රාම වැටුප් විෂමතා ඉවත්කර ගෙවීම් සිදු කිරීමේදී සිදුවන ප්‍රමාදයන් මගහරවා ගැනීම උදෙසා විෂමතා අංශයේ රාජකාරී පිණිස ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු විශ්‍රාම වැටුප් නිලධාරීන් ගෙන්වා එකී කටයුතු කඩිනමින් ඉටු කිරීමට කටයුතු යොදන ලදී.

## 05. සාධනයන්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වසර 2018 ඇතුළත සිදු කළ නව හඳුන්වාදීම් සහ වැඩිදියුණු කිරීම් හේතුවෙන් දෙපාර්තමේන්තුව තුළ සුවිශේෂී සාධනයන් රැසක් අත්කර ගැනීමට හැකිවිය. ඒ අනුව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 9/2015 (සංශෝධන III) ප්‍රකාරව මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලිය මාර්ගගතව සිදු කිරීමට හැකිවීම නිසා අයදුම්පත්‍ර මාර්ගගත ක්‍රමයට යොමු කිරීම මගින් කඩිනමින් අයදුම්පත්‍ර නිකුත් කර අඩුපාඩු පවතී නම් ඒවාද කඩිනමින් සම්පූර්ණ කර කාර්යක්ෂමව ගෙවීම් ක්‍රියාවලිය සිදු කිරීමට හැකිවිය. මරණ පාරිතෝෂික ගෙවීම් ක්‍රියාවලිය කඩිනම් වීමත් සමඟ ඉන් අනතුරුව ගෙවීම් සිදු කරන වැන්දඹු හා අනත්දරු ගෙවීම් ක්‍රියාවලිද කඩිනම් විය.

එමෙන්ම විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භයට ප්‍රථම විශ්‍රාමිකයා සමඟ පවත්වන සත්කාර පියසේ සම්මුඛ සාකච්ඡා ක්‍රියාවලියද කඩිනම් කිරීම නිසා නවක විශ්‍රාමික ප්‍රජාවට කඩිනමින් සිය ප්‍රතිලාභ ලබා දීමට හැකියාව ලැබිණි. ඒ අනුව 2018 වසර තුළ 27,856 ක් වූ විශ්‍රාමිකයින් සංඛ්‍යාවක් විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයකට භාජනය කළ අතර විශ්‍රාමිකයන් 27,878 කට නව විද්‍යුත් විශ්‍රාමික හැඳුනුම්පත්‍ර නිකුත් කරන ලදී.

විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කිරීමේ ක්‍රියාවලියේදී විශ්‍රාම වැටුප් සංශෝධන හිඟ ගෙවීම් 13,000 කට අධික ප්‍රමාණයක් තිබූ අතර 2018 වසර තුළදී එම සියළු හිඟ ගෙවීම් ගෙවා අවසන් කිරීමට හැකියාව ලැබිණි. තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් එවනු ලබන හිඟ ගෙවීම් ඒ ඒ මාසයන් තුළදීම ගෙවා අවසන් කිරීමට 2018 වසර තුළදී ක්‍රියාකරන ලදී.

වසර ගණනාවක සිට දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන වෙතින් අයවිය යුතුව තිබූ හිඟ ගොඩනැගිලි කුලී අයකර ගැනීමට 2018 වසරේදී පියවර ගත් අතර ඉන් වැඩි කොටසක් අයකර ගැනීමට ද හැකියාව ලැබිණි.

මානව සංවර්ධන ක්‍රියාවලියේදී සංවර්ධන නිලධාරී සේවයේ සේවා කාලය හා කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළද තනතුරේ ස්ථිර කිරීමට බාධාවක්ව පැවති පෞද්ගලික ලිපිගොනු විශාල ප්‍රමාණයක තිබූ අඩුපාඩු සම්පූර්ණ කර යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. එමගින් අදාළ නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීමට නිර්දේශ කර යැවීම හා සියළුම සංවර්ධන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නිසි පරිදි යාවත්කාලීන කිරීම සහ ලේඛණ සහකාර නිලධාරීන්ගේ සේවා අවශ්‍යතාවයන්ට අනුකූලව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත.



## 06. විශ්‍රාම වැටුප් ගෙවීම්

### 06. 1. වාර්ෂික විශ්‍රාමිකයින් සංඛ්‍යාව

| වර්ෂය | විශ්‍රාමිකයන් ගණන |
|---|---|
| 2014 | 546,379 |
| 2015 | 560,462 |
| 2016 | 579,508 |
| 2017 | 600,867 |
| 2018 | 621,905 |




මූලාශ්‍රය : ගිණුම් අංශය

- පළාත් අනුව විශ්‍රාමික ව්‍යාප්තිය -2018

| පළාත | විශ්‍රාමිකයන් ගණන | මුදල |
|---|---|---|
| ඌව පළාත | 33,180 | 815,920,749 |
| නැගෙනහිර පළාත | 25,200 | 637,839,893 |
| සබරගමුව පළාත | 50,168 | 1,289,057,093 |
| වයඹ පළාත | 71,393 | 1,850,421,693 |
| මධ්‍යම පළාත | 80,417 | 2,089,194,514 |
| උතුරු මැද පළාත | 40,007 | 1,013,575,194 |
| උතුරු පළාත | 20,705 | 524,790,005 |
| බස්නාහිර පළාත | 216,635 | 5,617,829,247 |
| දකුණු පළාත | 75,175 | 1,919,917,640 |
| විදේශ විශ්‍රාම වැටුප් | 9,025 | 255,090,300 |
| එකතුව | **621,905** | **16,013,636,328** |






මූලාශ්‍රය : ගිණුම් අංශය

- **මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් සාරාංශය**

| මාසය | සමස්ථ සක්‍රිය විශ්‍රාමිකයින් ගණන | | |
|---|---|---|---|
| | සිවිල් සහ හමුදා | වැන්දඹු හා අනත්දරු | එකතුව |
| ජනවාරි | 411,334 | 189,929 | **601,263** |
| පෙබරවාරි | 412,072 | 190,098 | **602,170** |
| මාර්තු | 413,603 | 190,306 | **603,909** |
| අප්‍රේල් | 415,761 | 190,566 | **606,327** |
| මැයි | 416,562 | 190,675 | **607,237** |
| ජූනි | 417,831 | 190,852 | **608,683** |
| ජූලි | 419,646 | 191,090 | **610,736** |
| අගෝස්තු | 420,066 | 190,180 | **610,246** |
| සැප්තැම්බර් | 422,048 | 190,734 | **612,782** |
| ඔක්තෝබර් | 423,370 | 190,917 | **614,287** |
| නොවැම්බර් | 425,913 | 191,473 | **617,386** |
| දෙසැම්බර් | 429,654 | 192,251 | **621,905** |

මූලාශ්‍රය : ගිණුම් අංශය

| මාසය | අළුතින් එකතු වූ විශ්‍රාමිකයින් ගණන 2018 | | | |
|---|---|---|---|---|
| | සිවිල් | *හමුදා | වැන්දඹු හා අනත්දරු | එකතුව |
| ජනවාරි | 1,547 | 103 | 343 | **1,993** |
| පෙබරවාරි | 1,416 | 270 | 845 | **2,531** |
| මාර්තු | 2,023 | 297 | 760 | **3,080** |
| අප්‍රේල් | 2,105 | 88 | 754 | **2,947** |
| මැයි | 1,556 | 152 | 694 | **2,402** |
| ජූනි | 2,650 | 147 | 1,051 | **3,848** |
| ජූලි | 2,367 | 239 | 812 | **3,418** |
| අගෝස්තු | 2,598 | 41 | 949 | **3,588** |
| සැප්තැම්බර් | 2,256 | 117 | 832 | **3,205** |
| ඔක්තෝබර් | 2,543 | 85 | 803 | **3,431** |
| නොවැම්බර් | 3,074 | 65 | 986 | **4,125** |
| දෙසැම්බර් | 4,251 | 49 | 1,167 | **5,467** |
| **එකතුව** | **28,386** | **1,653** | **9,996** | **40,035** |

මූලාශ්‍රය : ගිණුම් අංශය




මූලාශ්‍රය : ගිණුම් අංශය

- මරණ පාරිතෝෂික ගෙවීම් - 2018

| මාසය | ගෙවන ලද ලිපි ගොනු සංඛ්‍යාව |
|---|---|
| ජනවාරි | 167 |
| පෙබරවාරි | 45 |
| මාර්තු | 84 |
| අප්‍රේල් | 96 |
| මැයි | 122 |
| ජූනි | 38 |
| ජූලි | 44 |
| අගෝස්තු | 35 |
| සැප්තැම්බර් | 26 |
| ඔක්තෝබර් | 8 |
| නොවැම්බර් | 4 |
| දෙසැම්බර් | 10 |
| එකතුව | **679** |
| මාර්ගගත ක්‍රමය | 475 |
| මුළු එකතුව | **1154** |




- මියගිය හා දුබලතාවයට පත් වූ ත්‍රිවිධ හමුදා හා පොලිස් සේවයේ සාමාජිකයන්ට වැටුප් හා දීමනා ගෙවීම

| ත්‍රිවිධ හමුදා සහ පොලිස් ගෙවීම් | 2018 දෙසැම්බර් දක්වා | |
|---|---|---|
| | සංඛ්‍යාව | ගෙවූ මුදල රු.බිලියන |
| යුද හමුදා | 36,460 | 26.96 |
| නාවික හමුදා | 1,439 | 1.14 |
| ගුවන් හමුදා | 533 | 0.42 |
| පොලිස් | 2,337 | 1.83 |
| එකතුව | **40,769** | **30.35** |



- **ත්‍රිවිධ හමුදා සහ පොලිස් ගෙවීම්**

| | 2014 | | 2015 | | 2016 | | 2017 | | 2018 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු. මිලියන) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) | පුද්ගලයින් සංඛ්‍යාව | වියදම (රු.) |
| ශ්‍රී ලංකා යුද්ධ හමුදාව | 29,846 | 15,883 | 30,986 | 20,516 | 34,756 | 23,682 | 35,599 | 24,717 | 36,460 | 26,959 |
| ශ්‍රී ලංකා නාවික හමුදාව | 1,444 | 924 | 1,472 | 1,042 | 1,415 | 1,037 | 1,391 | 982 | 1,439 | 1,139 |
| ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 577 | 350 | 566 | 405 | 560 | 410 | 535 | 404 | 533 | 427 |
| ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව | 2,611 | 1,087 | 2,590 | 1,470 | 2,503 | 1,551 | 2,471 | 1,704 | 2,337 | 1,834 |
| මුළු වටිනාකම | **34,478** | **18,244** | **35,614** | **23,433** | **39,234** | **26,679** | **39,996** | **27,808** | **40,769** | **30,359** |
| | | | | | | | | | | |

## 06.2. පාරිතෝෂික ගෙවීම්

| පාරිතෝෂික වර්ගය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල(.රු) |
|---|---|---|
| සිවිල් | 27,400 | 23,826,294,186 |
| ගණන් බැලීම් | 1,444 | 569,905,539 |
| හමුදා | 210 | 86,298,818 |
| මරණ | 1,232 | 641,158,406 |
| වෙනත්* | 7,298 | 678,477,355 |
| එකතුව | **37,584** | **25,802,134,304** |

* සේවා පාරිතෝෂික (09), සංශෝධන පාරිතෝෂික විශේෂ වන්දි (10 හා සිවිල්), මරණ (17)






- **බැංකු අනුව විශ්‍රාමික ගෙවීම් වියාප්තිය - 2018**

| මාසය | මහජන බැංකුව | | ලංකා බැංකුව | | ඉතිරිකිරීමේ බැංකුව | |
|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම |
| ජනවාරි | 925 | 648,906,368 | 788 | 571,278,062 | 488 | 370,452,886 |
| පෙබරවාරි | 684 | 481,607,405 | 481 | 347,558,739 | 281 | 206,827,460 |
| මාර්තු | 1,320 | 970,612,013 | 960 | 729,280,662 | 613 | 468,726,965 |
| අප්‍රේල් | 619 | 486,429,103 | 675 | 523,548,339 | 424 | 337,782,172 |
| මැයි | 891 | 663,312,900 | 1,075 | 860,661,339 | 657 | 547,131,248 |
| ජූනි | 900 | 730,012,746 | 866 | 698,932,609 | 531 | 455,401,327 |
| ජූලි | 1,007 | 806,610,250 | 871 | 713,013,794 | 521 | 444,919,444 |
| අගෝස්තු | 1,425 | 1,135,589,592 | 1,170 | 921,226,274 | 805 | 672,496,309 |
| සැප්තැම්බර් | 920 | 728,837,834 | 701 | 559,866,364 | 482 | 407,103,455 |
| ඔක්තෝබර් | 1,071 | 813,244,627 | 818 | 660,927,309 | 557 | 459,502,891 |
| නොවැම්බර් | 1,027 | 841,145,621 | 904 | 775,243,048 | 617 | 558,712,237 |
| දෙසැම්බර් | 876 | 709,429,069 | 732 | 606,301,925 | 512 | 441,028,348 |
| එකතුව | **11,665** | **9,015,737,529** | **10,041** | **7,967,838,463** | **6,488** | **5,370,084,742** |

මූලාශ්‍රය : ගිණුම් අංශය

- **බැංකු අනුව පාරිතෝෂික ගෙවීම**

| වර්ෂය | මහජන බැංකුව | | ලංකා බැංකුව | | ඉතිරිකිරීමේ බැංකුව | |
|---|---|---|---|---|---|---|
| | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම | විශ්‍රාමිකයින් ගණන | වටිනාකම |
| 2016 | 10,569 | 5,839,820,740 | 8,435 | 4,740,430,451 | 4,263 | 2,400,917,501 |
| 2017 | 12,581 | 8,055,213,108 | 9,307 | 6,115,014,815 | 5,005 | 3,420,559,676 |
| 2018 | 11,665 | 9,015,737,529 | 10,041 | 7,967,838,463 | 6,488 | 5,370,084,742 |
| එකතුව | **34,815** | **22,910,771,377** | **27,783** | **18,823,283,729** | **15,756** | **11,191,561,919** |

මූලාශ්‍රය : ගිණුම් අංශය

## 06.3. හිඟ වැටුප් ගෙවීම් - 2018

හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමට සිදුවන්නේ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීම ප්‍රමාද වීම, නොදන්වා විදෙස්ගත වීම, වැටුප් විෂමතා ගැලපීම යන හේතු නිසාය. ඒ අනුව හිඟ ගෙවීම ලක්ෂ 5 ට වැඩි හා ලක්ෂ 10ට වැඩි ගොනු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙන්වා ගෙන කමිටුවක් මඟින් පරීක්ෂා කොට හිඟ ගෙවනු ලබයි. ලක්ෂ 5ට අඩු හිඟ ගෙවීම් විශ්‍රාමික ලිපි ගොනු ගෙන්වා ගැනීමකින් තොරව අත්‍යවශ්‍ය ලිපි ලේඛන ප්‍රාදේශීය ලේකම් මඟින් AR ලෙස පරිලෝකනය කරවා ගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් එම ලේඛන පරීක්ෂා කොට හිඟ ගෙවීම් සිදු කරනු ලබයි. ඒ අනුව 2018 වර්ෂය සඳහා කරන ලද හිඟ ගෙවීම් පහත පරිදි දක්වා ඇත.

| මාසය | සංඛ්‍යාව | මාසික වියදම |
|---|---|---|
| ජනවාරි | 759 | 43,710,628 |
| පෙබරවාරි | 2,414 | 139,830,201 |
| මාර්තු | 1,147 | 72,615,932 |
| අප්‍රේල් | 1,312 | 77,444,662 |
| මැයි | 892 | 51,642,627 |
| ජූනි | 1,119 | 72,137,445 |
| ජූලි | 1,044 | 71,849,750 |
| අගෝස්තු | 668 | 51,821,400 |
| සැප්තැම්බර් | 1,251 | 78,381,271 |
| ඔක්තෝබර් | 966 | 52,008,918 |
| නොවැම්බර් | 792 | 43,657,430 |
| දෙසැම්බර් | 1,252 | 65,761,563 |
| **එකතුව** | **13,616** | **820,861,827** |



## 06.4. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ලැබීම් හා ගෙවීම් (8%+ 12%) 2018

2018 වර්ෂය සඳහා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සඳහා අනිවාර්ය දායක මුදල් (8%) ලැබීම රු.296,797,239.00 ක් වන අතර රජයේ ප්‍රසාද මුදල (12%) රු.439,403,601.00 ක් වේ. අරමුදලින් වර්ෂය සඳහා ගෙවීම් රු.354,979,756 ක් වේ.

| මාසය | ලැබීම් (රු.) | ගෙවීම් (රු.) |
|---|---|---|
| ජනවාරි | 59,499,451 | 33,766,397 |
| පෙබරවාරි | 49,327,311 | 39,038,292 |
| මාර්තු | 52,287,270 | 19,317,506 |
| අප්‍රේල් | 55,312,972 | 33,253,465 |
| මැයි | 56,910,617 | 21,414,708 |
| ජූනි | 39,493,263 | 18,696,515 |
| ජූලි | 51,515,599 | 17,647,927 |
| අගෝස්තු | 56,034,460 | 35,021,301 |
| සැප්තැම්බර් | 85,410,435 | 8,608,894 |
| ඔක්තෝබර් | 93,505,460 | 46,585,902 |
| නොවැම්බර් | 86,822,096 | 38,059,593 |
| දෙසැම්බර් | 50,081,961 | 43,569,255 |
| එකතුව | **736,200,895** | **354,979,756** |




- **2018 වසරේ අලුතින් එක් වූ හා ඉවත් වූ සාමාජික සංඛ්‍යාව (රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල්)**

| මාසය | ඉවත් වූ සාමාජික සංඛ්‍යාව | එක් වූ සාමාජික සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 509 | 109 |
| පෙබරවාරි | 500 | 153 |
| මාර්තු | 293 | 118 |
| අප්‍රේල් | 342 | 154 |
| මැයි | 322 | 202 |
| ජූනි | 363 | 287 |
| ජූලි | 301 | 478 |
| අගෝස්තු | 453 | 654 |
| සැප්තැම්බර් | 103 | 514 |
| ඔක්තෝබර් | 690 | 787 |
| නොවැම්බර් | 496 | 539 |
| දෙසැම්බර් | 584 | 563 |
| එකතුව | **4,956** | **4,558** |



## 06.5. ගොඩනැගිලි කුලී ලැබීම් හා නිවාඩු නිකේතන ආදායම්

- **ගොඩනැගිලි කුලී ලැබීම් 2018**

| ආයතනයේ නම | ගොඩනැගිලි කුලී ලැබීම් ( රු) |
|---|---|
| හයිලන්ඩ් කිරිහල | 126,000 |
| සම්පත් බැංකුව AT M | 270,600 |
| හැටන් නැෂනල් බැංකුව | 2,100,000 |
| හැටන් නැෂනල් බැංකුව ATM | 264,000 |
| රාජ්‍ය සේවා විශ්‍රාමිකයින්ගේ භාර අරමුදල | 120,000 |
| රාජ්‍ය සේවා විශ්‍රාමික II කොටස | 48,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය | 4,080,000 |
| ලංකා හොස්පිටල් සමාගම (පුද්) | 408,000 |
| පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව | 1,560,000 |
| පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය | 8,400,000 |
| ආපන ශාලාව | 386,100 |
| පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (.ප.බ) | 3,165,000 |
| සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය (.ප.බ) | 4,080,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා | 3,600,000 |
| ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය II කොටස | |
| රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | 240,000 |
| තැපැල් කාර්යාලය | 2,160,000 |
| එකතුව | **31,847,700** |




- **නිවාඩු නිකේතන ආදායම**

| නිවාඩු නිකේතනයේ නම | ආදායම (රු) |
|---|---|
| රම්බොඩ නිවාඩු නිකේතනය | 353,100 |
| කැලණිය වෙදමුල්ල නිවාඩු නිකේතනය | 8,811,585 |
| **මුළු ආදායම** | **9,164,685** |

මූලාශ්‍රය : ගිණුම් අංශය, පාලන අංශය

# 07.

# මූල්‍ය ප්‍රකාශන

- 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව (විගණිත වාර්තාව) අනුව පහත ගිණුම් වාර්තා ඇතුලත් කර ඇත.

  - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ගිණුම්
  - පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
  - පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
  - පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල

## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්
රු.

| අයවැය 2018 | | තතය 2018 | 2017 |
|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | |
| - | ආදායම් බදු | - | - |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | - | - |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | - | - |
| 26,000,000,000.00 | බදු නොවන ආදායම් හා වෙනත් | 25,213,646,618 | - |
| 26,000,000,000.00 | **මුළු ආදායම් ලැබීම්** | 25,213,646,618 | - |
| - | **ආදායම් නොවන ලැබීම්** | | |
| | භාණ්ඩාගාර අග්‍රිම | 182,967,680,000 | - |
| | භාණ්ඩාගාරයට ආපසු යැවීම් | (1,700,000,000) | |
| | භාණ්ඩාගාර අග්‍රිම (ශුද්ධ) | 181,267,680,000 | |
| | තැන්පතු | 17,467,659 | |
| - | අත්තිකාරම් ගිණුම් | 48,947,134 | |
| | වෙනත් ලැබීම් | 27,819,626,215 | |
| | **මුළු ආදායම් නොවන ලැබීම්** | **209,153,721,008** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම්** | **234,367,367,626** | |
| | **අඩුකළා :- වියදම්** | | |
| - | **පුනරාවර්තන වියදම්** | | |
| 465,019,631.00 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 464,669,718 | |
| 73,375,000.00 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 72,390,290 | |
| 228,639,505,369.00 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 224,866,916,448 | |
| - | පොළී ගෙවීම් | - | |
| | වෙනත් පුනරාවර්තන වියදම් | - | |
| 229,177,900,000.00 | **මුළු පුනරාවර්තන වියදම** | **225,403,976,456** | |
| | **මූලධන වියදම්** | | |
| 22,850,000.00 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 22,547,715 | |
| 8,917,500.00 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 8,682,085 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | - | |
| 1,762,500.00 | හැකියා වර්ධනය | 1,686,952 | |
| 31,000,000.00 | වෙනත් මූලධන වියදම් | 30,993,314 | |
| 64,530,000.00 | **මුළු මූලධන වියදම්** | **63,910,066** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම්** | **26,900,461,785** | |
| | **තැන්පතු ගෙවීම්** | 14,447,230 | |
| | **අත්තිකාරම් ගෙවීම්** | 61,968,169 | |
| | **වෙනත් ගෙවීම්** | 26,824,046,386 | |
| 229,242,430,000.00 | **මුළු වියදම්** | **252,368,348,307** | |
| | 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | **(18,000,980,681)** | |

# 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

**වියදම් ශීර්ෂ අංකය : 253**

**දෙපාර්තමේන්තුවේ නම : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් (1) | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් (2) | මු.රෙ. 66/69 මාරුකිරීම් (3) | මුළු ශුද්ධ වෙන්කිරීම් (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 229,181,180,000 | 0 | -3,280,000 | 229,177,900,000 | 225,403,976,456 | 3,773,923,544 |
| | (2) ප්‍රාග්ධන | 61,250,000 | 0 | 3,280,000 | 64,530,000 | 63,910,066 | 619,934 |
| | **උප එකතුව** | 229,242,430,000 | 0 | 0 | 229,242,430,000 | 225,467,886,522 | 3,774,543,478 |
| | **මුළු එකතුව** | **229,242,430,000** | **0** | **0** | **229,242,430,000** | **225,467,886,522** | **3,774,543,478** |

## වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශය

**වියදම් ශීර්ෂ අංකය : 253** | **දෙපාර්තමේන්තුවේ නම :- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**

| වැය විෂය | වැඩසටහන (1) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම් | | |
| | **(1)** | **(2)** | **(3)** | **(4)=(1)+(2)+(3)** | **(5)** | **(11)=(5)** |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | | | | |
| 1001 වැටුප් හා වේතන | 319,000,000 | | 9,200,000 | 328,200,000 | 328,092,205 | 328,092,205 |
| 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් | 6,000,000 | | 722,000 | 6,722,000 | 6,712,862 | 6,712,862 |
| 1003 වෙනත් දීමනා | 125,000,000 | | 5,097,631 | 130,097,631 | 129,864,650 | 129,864,650 |
| **ගමන් වියදම්** | | | | | | |
| 1101 දේශීය | 2,300,000 | | 248,000 | 2,548,000 | 2,467,461 | 2,467,461 |
| 1102 විදේශීය | 2,000,000 | | -1,159,000 | 841,000 | 840,450 | 840,450 |
| **සැපයීම්** | | | | | | |
| 1201 ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 8,400,000 | | -2,150,000 | 6,250,000 | 6,228,661 | 6,228,661 |
| 1202 ඉන්ධන | 4,500,000 | | -852,000 | 3,648,000 | 3,636,901 | 3,636,901 |
| 1203 ආහාර පාන හා නිල ඇඳුම් | 250,000 | | 0 | 250,000 | 245,335 | 245,335 |

| වැය විෂය | වැඩසටහන (1) | | | | | මුළු වියදම |
|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | | | | වියදම | |
| | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම් | | |
| **නඩත්තු වියදම්** | | | | | | |
| 1301 වාහන | 2,900,000 | | | 2,900,000 | 2,689,545 | 2,689,545 |
| 1302 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2,000,000 | | 846,000 | 2,846,000 | 2,845,237 | 2,845,237 |
| 1303 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,000,000 | | 1,582,000 | 2,582,000 | 2,569,134 | 2,569,134 |
| **සේවා** | | | | | | |
| 1401 ප්‍රවාහන | 30,000 | | 1,000,000 | 1,030,000 | 861,065 | 861,065 |
| 1402 තැපැල් හා සන්නිවේදන | 7,600,000 | | 5,000,000 | 12,600,000 | 12,565,771 | 12,565,771 |
| 1403 විදුලිය හා ජලය | 14,000,000 | | 900,000 | 14,900,000 | 14,497,912 | 14,497,912 |
| 1404 බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 2,300,000 | | 2,080,000 | 4,380,000 | 4,378,968 | 4,378,968 |
| 1409 වෙනත් | 13,000,000 | | 5,600,000 | 18,600,000 | 18,563,852 | 18,563,852 |
| **මාරුකිරීම්** | | | | | | |
| 1501 සුභසාධන වැඩසටහන් | 30,000,000,000 | | 358,720,000 | 30,358,720,000 | 30,358,716,301 | 30,358,716,301 |
| 1502 විශ්‍රාමික ප්‍රතිලාභ | 198,659,000,000 | | -391,800,631 | 198,267,199,369 | 194,494,729,522 | 194,494,729,522 |
| 1506 රජයේ සේවකයන් සඳහා දේපළ ණය පොළී | 10,400,000 | | -764,000 | 9,636,000 | 9,556,641 | 9,556,641 |
| 1508 වෙනත් | 1,500,000 | | 2,450,000 | 3,950,000 | 3,913,983 | 3,913,983 |
| **මුළු එකතුව** | **229,181,180,000** | **0** | **-3,280,000** | **229,177,900,000** | **225,403,976,456** | **225,403,976,456** |

| වැය විෂය | වැඩසටහන (1) | | | | | |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | ප්‍රතිපාදනය | | | | වියදම | මුළු වියදම |
| | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම් | පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් | මු.රෙ. 66/69 මාරුකිරීම් | මුළු ශුද්ධ වෙන්කිරීම් | | |
| **මූලධන වියදම්** | | | | | | |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | | | | |
| 2001 ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 10,000,000 | | 11,100,000 | 21,100,000 | 21,095,862 | 21,095,862 |
| 2002 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 750,000 | | | 750,000 | 736,932 | 736,932 |
| 2003 වාහන | 1,000,000 | | | 1,000,000 | 714,921 | 714,921 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | | | | |
| 2102 ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000,000 | | 865,000 | 3,865,000 | 3,673,394 | 3,673,394 |
| 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,000,000 | | 2,052,500 | 5,052,500 | 5,008,691 | 5,008,691 |
| **හැකියා වර්ධනය** | | | | | | |
| 2401 කාර්යය මණ්ඩල පුහුණු | 2,500,000 | | -737,500 | 1,762,500 | 1,686,953 | 1,686,953 |
| **වෙනත් මූලධන වියදම්** | | | | | | |
| 2509 වෙනත් | 41,000,000 | | -10,000,000 | 31,000,000 | 30,993,314 | 30,993,314 |
| **මුළු එකතුව** | **61,250,000** | **0** | **3,280,000** | **64,530,000** | **63,910,066** | **63,910,066** |
| **මුළු පුනරාවර්තන හා මූලධන වියදම්වල එකතුව** | **229,242,430,000** | **0** | **0** | **229,242,430,000** | **225,467,886,522** | **225,467,886,522** |

## වැඩසටහන් අනුව වියදම් මූලාකරණ සාරාංශය

**දෙපාර්තමේන්තුවේ නම** : විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**වියදම් ශීර්ෂ අංකය** : 253

| | මූලාකරණය | වැඩසටහන 01 | | මුළු එකතුව | | |
|---|---|---|---|---|---|---|
| සංකේතය | සංකේත විස්තරය | ශුද්ධ ප්‍රතිපාදනය 1 රු. | සත්‍ය වියදම 2 රු. | ශුද්ධ ප්‍රතිපාදනය 5 රු. | සත්‍ය වියදම 6 රු. | වියදමේ ප්‍රතිශතය (6÷5)X100 % |
| 11 | දේශීය අරමුදල් | 181,003,430,000 | 179,566,850,678 | 181,003,430,000 | 179,566,850,678 | 99 |
| 12 | විදේශ ණය | | | | | |
| 13 | විදේශ ප්‍රදාන | | | | | |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | | | | | |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | | | | | |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | | | | | |
| 17 | විදේශ මූලායන ආශ්‍රිත දේශීය පිරිවැය | | | | | |
| 18 | විදේශ මූලායන ආශ්‍රිත දේශීය සම මූල්‍යනය | | | | | |
| 21 | විශේෂ නීති සේවා | 48,239,000,000 | 45,901,035,844 | 48,239,000,000 | 45,901,035,844 | 95 |
| | **එකතුව** | 229,242,430,000 | 225,467,886,522 | 229,242,430,000 | 225,467,886,522 | 98 |

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල**

**2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම**

| වියදම් | මුදල (රු.) | | ආදායම් | මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | | 2017 | 2018 |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 150,445,495.06 | 109,844,278.93 | ආයතන දායක මුදල් ගිණුම | 85,459,868.95 | 80,121,870.42 |
| ඌනතාවය සමුච්ත අරමුදලට මාරු කිරීම | (64,985,626.11) | (29,722,408.51) | | | |
| | 85,459,868.95 | 80,121,870.42 | | 85,459,868.95 | 80,121,870.42 |

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල**

**2018.12.31 දිනට ශේෂ පත්‍රය**

| බැරකම් | මුදල (රු.) | | වත්කම් | මුදල (රු.) | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | | 2017 | 2018 |
| සමුච්චිත අරමුදල | 1,382,039,108.52 | 1,314,632,550.60 | ලැබිය යුතු දායක මුදල් | 1,317,604,315.77 | 1,285,727,817.89 |
| එකතු කළා<br>අතිරික්තය/ඌනතාවය | (64,985,626.11) | (29,722,408.51) | | | |
| | 1,317,053,482.41 | 1,284,910,142.09 | | 1,317,604,315.77 | 1,285,727,817.89 |
| කලින් ලද දායක මුදල් | 550,833.36 | 817,675.80 | | | |
| | 1,317,604,315.77 | 1,285,727,817.89 | | 1,317,604,315.77 | 1,285,727,817.89 |

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## ආදායම් හා වියදම් ගිණුම

| වියදම් | මුදල (රු:) | | ආදායම් | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | | 2017 | 2018 |
| | | | පොලී ලැබීම් :- | | |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 11,504,404 | 140,943,078.69 | භාණ්ඩාගාර බැඳුම්කර | 11,489,535 | 2,848,775.12 |
| බැංකු ගාස්තු | 200 | - | ප්‍රාග්ධන ලා/ලාභ ගිණුම | | 13,393,569.68 |
| | | | ඌණතාවය (සමුච්චිත අරමුදලට මාරු කිරීම) | 15,069 | 124,700,733.89 |
| | **11,504,604** | **140,943,078.69** | | **11,504,604** | **140,943,078.69** |

## පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2018-12-31 දිනට ශේෂ පත්‍රය

| බැරකම් | මුදල (රු:) | | වත්කම් | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | | 2017 | 2018 |
| සමුච්චිත අරමුදල | 124,688,492.05 | 124,700,733.89 | ආයෝජන ගිණුම - | | |
| අඩු කලා | | | භාණ්ඩාගාර බැදුම්කර | 121,777,430.32 | - |
| ඌණතාවය | (15,069.35) | (124,700,733.89) | | | |
| | 124,673,422.70 | - | ලැබිය යුතු ආයෝජන පොළී - | | |
| | | | භාණ්ඩාගාර බැදුම්කර | 2,895,992.38 | - |
| | 124,673,422.70 | - | | 124,673,422.70 | |

## පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## ආදායම් හා වියදම් ගිණුම

| විස්තරය | මුදල (රු:) | | විස්තරය | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | | 2017 | 2018 |
| විශ්‍රාම වැටුප් දායකත්වය | 203,298.97 | 352,201.60 | ඌනතාවය | 203,298.97 | 352,201.60 |
| | **203,298.97** | **352,201.60** | | **203,298.97** | **352,201.60** |

## පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල
## 2018.12.31 දිනට ශේෂ පත්‍රය

| විස්තරය | මුදල (රු:) | | විස්තරය | මුදල (රු:) | |
|---|---|---|---|---|---|
| | 2017 | 2018 | | 2017 | 2018 |
| සමුච්චිත අරමුදල | 203,298.97 | 352,201.60 | ආයෝජන | - | - |
| (-) ඌනතාවය | (203,298.97) | (352,201.60) | | | |
| | | | | - | - |

## 2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම

**ආදායම් ගණන්දීමේ නිලධාරි:-** විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් **වියදම් ශීර්ෂ අංකය** :- 253

| ආදායම් සංකේතය | ආදායම් සංකේත විස්තරය | 2018 මුලික ආදායම් ඇස්තමේන්තුව | 2018 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | 2018 රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම (දළ ආදායම-ආදායම් ආපසු ගෙවීම්) | 2017 රැස්කරන ලද මුළු ශු.ආදායම (දළ ආදායම-ආදායම් ආපසු ගෙවීම්) |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 20.04.02.00 | සමාජ සංරක්ෂණ දායක මුදල් පළාත් සභා | 10,000,000,000 | 10,000,000,000 | 8,682,995,262 | 7,409,266,605 |
| | **එකතුව** | 10,000,000,000 | 10,000,000,000 | 8,682,995,262 | 7,409,266,605 |

# 2018 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආදායම් ගිණුම

**ආදායම් ගණන්දීමේ නිලධාරි :-** විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් **වියදම් ශීර්ෂ අංකය** :- 253

| ආදායම් සංකේතය | ආදායම් සංකේත විස්තරය | 2018 මුලික ආදායම් ඇස්තමේන්තුව | 2018 සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | 2018 රැස්කරන ලද මුළු ශුද්ධ ආදායම (දළ ආදායම- ආදායම් ආපසු ගෙවීම්) | 2017 රැස්කරන ලද මුළු ශු.ආදායම (දළ ආදායම-ආදායම් ආපසු ගෙවීම්) |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| 20.04.01.00 | සමාජ සංරක්ෂණ දායක මුදල් මධ්‍යම රජය | 16,000,000,000 | 16,000,000,000 | 16,530,651,357 | 15,531,146,912 |
| | **එකතුව** | 16,000,000,000 | 16,000,000,000 | 16,530,651,357 | 15,531,146,912 |

**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල**

**2018-12-31 අවසන් වර්ෂය සඳහා**

**ආදායම් වියදම් ගිණුම**

| විස්තරය | 2017 (රු.) | 2018 (රු.) | විස්තරය | 2017 (රු.) | 2018 (රු.) |
|---|---|---|---|---|---|
| දායක මුදල් ආපසු ගෙවීම | 5,500,946.66 | 5,993,250.78 | වර්ෂයට අදාළ දායක මුදල් | 81,709,939.57 | 82,964,362.91 |
| බදු | 4,847,683.51 | 3,764,880.42 | පොළී ආදායම් | 60,596,043.67 | 75,164,692.14 |
| අතිරික්තය | 131,957,353.07 | 148,370,923.85 | | | |
| | **142,305,983.24** | **158,129,055.05** | | **142,305,983.24** | **158,129,055.05** |

## ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

## 2018-12-31 දිනට ශේෂ පත්‍රය

| | 2017 (රු.) | 2018 (රු.) | | 2017 (රු.) | | 2018 (රු.) | |
|---|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | 1,350,530,396.46 | 1,484,488,651.75 | ආයෝජන වටිනාකම | | 639,617,175.66 | | 724,045,883.12 |
| | | | **ප්‍රවර්තන වත්කම්** | | | | |
| | | | ලැබිය යුතු පොළී | 75,985,097.14 | | 61,977,153.52 | |
| | | | ලැබිය යුතු මුදල් | 4,805,044.46 | | 3,753,885.58 | |
| | | | භා.නි.ලේ. ශේෂය | 768,159,240.04 | 848,949,381.64 | 846,181,511.05 | 911,912,550.15 |
| **එකතු කලා** | | | | | | | |
| අතිරික්තය | 131,957,353.07 | 148,370,923.85 | | | | | |
| | 1,482,487,749.53 | 1,632,859,575.60 | | | | | |
| **ජංගම බැරකම්** | | | | | | | |
| ගෙවිය යුතු බදු | 6,078,807.77 | 3,098,857.67 | | | | | |
| | **1,488,566,557.30** | **1,635,958,433.27** | | | **1,488,566,557.30** | | **1,635,958,433.27** |

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල**
**ආදායම් වියදම් ගිණුම**
**2018.12.31න් අවසන් වර්ෂය සඳහා**

| | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| | | | | |
| බදු පෙර පොළී ආදායම | | **6,927,587,728** | | 5,737,834,950 |
| අඩු කළා - බදු | | **(135,367,581)** | | (83,357,061) |
| බදු පසු පොළී ආදායම | | **6,792,220,141** | | 5,654,477,889 |
| | | | | |
| **අඩු කළා - වියදම්** | | | | |
| | | | | |
| විදුලිය | 486,638 | | 465,078 | |
| ජලය | 54,415 | | 12,136 | |
| වැටුප් හා වේතන | 10,349,476 | | 10,399,153 | |
| අතිකාල දීමනා | 447,211 | | 461,583 | |
| දීමනා | 57,500 | | 57,500 | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාල වියදම් | 223,193 | | 431,404 | |
| නිදහස් දුම්රිය බලපත්‍ර | 26,175 | | 23,520 | |
| ප්‍රවාහන හා සන්නිවේදනය | 124,026 | | - | |
| ක්ෂයවීම් | 179,522 | | 25,188 | |
| වෙනත් පුනරාවර්තන වියදම් | 16,268 | | 15,495 | |
| වෙනත් වියදම් | 142,464 | | - | |
| විගණන ගාස්තු | 172,500 | **12,279,387** | 172,500 | 12,063,558 |
| **අතිරික්තය** | | **6,779,940,754** | | 5,642,414,331 |
| | | | | |
| **එකතු කළා - පොදු සංචිතයෙන් මාරුකිරීම්** | | **2,047,764** | | 2,769,293 |
| | | | | |
| **දායකයන්ට විසර්ජනය කළ හැකි ආදායම** | | **6,781,988,518** | | 5,645,183,624 |
| | | | | |
| **පොළී විසර්ජනය** | | | | |
| | | | | |
| අනිවාර්ය දායකත්වය | 2,708,052,846 | | 2,234,275,558 | |
| ස්වේච්ඡා දායකත්වය | 4,211,102 | | 3,468,034 | |
| රජයේ දායකත්වය | 4,065,000,904 | **6,777,264,852** | 3,405,276,801 | 5,643,020,393 |
| **විසර්ජනය කිරීමෙන් හා පොදු සංචිතයෙන් මාරු කිරීමෙන් පසු අතිරික්ත පොළී ආදායම** | | **4,723,666** | | 2,163,231 |

## රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල
## 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| ලී බඩු හා සවිකිරීම් | - | | 6,697 | |
| අනෙකුත් උපකරණ | - | | 92,628 | |
| පරිගණක උපාංග | - | - | 80,197 | 179,522 |
| ආයෝජන ගිණුම -පිරිවැයට | | **25,190,659,288** | | 34,050,366,302 |
| | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| ආයෝජනය පිරිවැයට | **33,468,586,147** | | 18,870,215,298 | |
| ලැබිය යුතු පොලී | **3,677,771,439** | | 2,229,078,288 | |
| ලැබිය යුතු රජයේ දායක මුදල් | **23,196,271** | | 17,403,931 | |
| ගැලපුම් ගිණුම | **29,448,892** | | 29,209,393 | |
| කලින් ගෙවීම් | - | | 141,721 | |
| ගිණුමේ ශේෂය | **13,383,274** | **37,212,386,023** | 223,640,307 | 21,369,688,938 |
| **මුළු වත්කම්** | | **62,403,045,311** | | 55,420,234,762 |
| | | | | |
| **මූලධන හා බැරකම්** | | | | |
| | | | | |
| **සමුච්චිත අරමුදල** | | | | |
| අනිවාර්යය දායක මුදල් | **24,307,762,204** | | 21,479,409,368 | |
| ස්වේච්ඡා දායක මුදල් | **37,786,900** | | 33,394,939 | |
| රජයේ දායක මුදල් | **37,726,385,705** | **62,071,934,809** | 33,418,512,038 | 54,931,316,345 |
| | | | | |
| **සංචිත** | | | | |
| ප්‍රාග්ධන සංචිත | **3,790** | | 3,790 | |
| පොදු සංචිත | **4,723,666** | **4,727,456** | 2,163,231 | 2,167,021 |
| | | | | |
| **ජංගම බැරකම්** | | | | |
| උපචිත විගණන ගාස්තු | **690,000** | | 517,500 | |
| නොගෙවන ලද රජයේ ප්‍රසාද මුදල් | **313,813,696** | | 474,425,527 | |
| උපචිත වියදම් | **11,879,350** | **326,383,046** | 11,808,369 | 486,751,396 |
| **මුළු මූලධන සහ බැරකම්** | | **62,403,045,311** | | 55,420,234,762 |
| | | | | |

# 08.

# විගණකාධිපති වාර්තා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ/ඩී/ඩීඹපී/02/19/11 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි31 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1)වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ,සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 කත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැර වීම.**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව කටයුතු නොකර, අරමුදලේ ආදායම උපචිත පදනම හා වියදම මුදල් පදනම අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර තිබුණි.

**(ආ) පැහැදිලි නොකළ වෙනස්කම්**

2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශිය සභා හා නගර සභාවල ලැබිය යුතු දායක මුදල් ශේෂය හා සැසඳු සනාථ කිරීම් අනුව, මූල්‍ය ප්‍රකාශ ශේෂයන්ගේ වටිනාකම සභා 10 ක රු. 9,565,464 ක් වැඩියෙන්ද, සභා 1 ක ශේෂයේ රු. 172,150 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබ අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂ මත පදනමව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්ථාවේ 1.2 (අ), (ආ) ඡේදවල දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2018 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන ආයතන292 කින් ලැබිය යුතු ශේෂය රු. 1,285,727,817 ක් විය. මෙයින් වටිනාකම රු. 218,898,449 ක් වූ පළාත් පාලන ආයතන 126 ක වර්ෂ 5 ක වර්ෂ 10 ක අතර කාල පරාසයක, වටිනාකම රු. 926,069,312 ක් වර්ෂ 10 ට වැඩි කාලයක සිට අය නොවන ශේෂ බැවින්, අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු විශ්‍රාම වැටුප් දායක මුදල් උප ලේඛනවලට අනුව සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන ආයතන සංඛ්‍යාව 94 කින් අයවිය යුතු දායක මුදල් රු. 461,818,600 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2. කාර්යසාධනය

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 15 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත දීමනා ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරින්ට රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 දින සිට අරමුදලට නව සාමාජිකයින් එකතු වීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජිකයින්ගේ මුදල් එකතු නොවීම හා සිටින සාමාජිකයින්ගේ දායකය විශ්‍රාම වැටුප් ගෙවීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂය යටතේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මඟින් විශ්‍රාම වැටුප් වියදම් දරා තිබූ අතර ප්‍රවර්ථන වර්ෂයේ එසේ දරන ලද වියදම රු.1,085,161,850 වී තිබුණි. මේ හේතුවෙන් අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ්/ඩ්/ඩීඔපී/02/19/12    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 මැයි 27 දින.

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 අභිතකර මතය**

පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**1.2 අහිතකර මතය සඳහා පදනම**

**ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ පෙර වර්ෂවලට අදාළ විශ්‍රාම වැටුප් දායක මුදල් රු.352,201 ක් සමුච්චිත අරමුදලට ගලපා තිබූ අතර, එම මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම ආදායම් හා වියදම් ගිණුමට ගලපා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඌනතාවයක් ඇති වී තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- මෙම වාර්තාවේ 1.2 හි නිර්දේශය හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1. කාර්යසාධනය

1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 16 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරින්හට රාජ්‍ය නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 සිට සමාලෝචිත වර්ෂය දක්වා මෙම අරමුදලට නව සාමාජිකයින් එකතුවීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජික මුදල් නොලැබීම නිසා මෙම නිලධාරින්ට ගෙවීමට ප්‍රමාණවත් තරම් මුදල් අරමුදලේ නොමැති වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දරා තිබු අතර ප්‍රවර්ථන වර්ෂයේ එසේ දරන ලද වියදම රු. 941,275,505 ක් වී තිබුණි. මේ හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු ඉටු වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඩීබී/ඩී/ඩීඑපී/02/19/13    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2019 මැයි 29 දින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

කාර්යසාධනය

1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ 14 වගන්තිය ප්‍රකාරව පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹු පුරුෂයන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ අරමුණින් මෙම අරමුදල පිහිටුවා තිබුණි. එසේ වුවද, 1993 වර්ෂයේ පළාත් රාජ්‍ය සේවය ස්ථාපිත වීමත් සමඟ පළාත් රාජ්‍ය නිලධාරීන්හට රාජ්‍ය නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හිමිවීම නිසා 1993 සැප්තැම්බර් 03 සිට සමාලෝචිත වර්ෂය දක්වා මෙම අරමුදලට නව සාමාජිකයින් එකතුවීමක් සිදු වී නොතිබුණි. එලෙස නව සාමාජික මුදල් නොලැබීම නිසා මෙම නිලධාරීන්ට ගෙවීමට ප්‍රමාණවත් තරම් මුදල් අරමුදලේ නොමැති වීම හේතුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් අරමුදලේ වියදම් දරා තිබූ අතර, ප්‍රවර්ථන වර්ෂයේ එසේ දරන ලද වියදම රු. 67,119,987 ක් වී තිබුණි. මේ හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු ඉටු වී නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : එල්ඊඩබ්/ඩී/ඩීඔපී/02/19/14

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2019 මැයි දින.

<u>රහසිගතයි</u> (කෙටුම්පත)

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුම සැසඳුම් ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම කෙටුම්පත් වාර්තාවේ නිරීක්ෂණ වලට ආයතනයේ අදහස් දැක්වීමෙන් පසුව මතය ප්‍රකාශ කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

1.2 මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

(i) ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් මුදල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වැය ශිර්ෂයෙන් ගෙවනු ලබන අතර, එකී වියදම හඳුනාගෙන අරමුදලේ ගෙවීම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු නිසා 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයෙහි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ශේෂය ලෙස රු. 846,181,511 ක වටිනාකමක් වත්කම් ලෙස දක්වා තිබුණි.

(ii) වයඹ, දකුණ, නැගෙනහිර, උතුරු මැද, ඌව හා උතුර යන පළාත්වලට අදාල දායක මුදල් අරමුදලට බැර වී නොතිබූ අතර ඒවා ලැබිය යුතු දායක මුදල් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) විගණනය සඳහා සාක්ෂි නොවීම

පිරිවෙන් හා පෞද්ගලික / උපකෘත පාසැල්වල ගුරුවරුන්ගෙන් වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලෙස සියයට 6 ක්ද ඔවුන් රාජ්‍ය නිලධාරීන් ලෙස පූර්ණ වශයෙන් පිළි නොගන්නා බැවින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප සඳහා සියයට 6 ක්ද වශයෙන් අරමුණු 2 ක් වෙනුවෙන් දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු වේ. එසේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ගිණුම් සාරාංශ යටතේ බැර නිවේදන මගින් 2018 වර්ෂයේදී 8186 දරණ ගිණුමට පළාත් 3කින් පමණක් බැර කරන ලද රු. 66,918,348 ක් වූ මුදල කුමන දායකත්වය සඳහා බැර කරන ලද්දේ ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදල මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- මෙම වාර්තාවේ 1:2 (අ) (ආ) හි නිර්දේශයන් හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) නියෝගය ප්‍රකාරව එක් එක් ආධාර මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයන් පවත්වා නොතිබුණි.

3.2 කාර්ය සාධනය

1953 අංක 44 දරණ පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත් නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල් මඟින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කල යුතුය. එසේ වුවත් දායක මුදල් රැස් කිරීම හා වියදම් දැරීම සඳහා අරමුදල වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර දායක මුදල් වැන්දඹු අනත්දරු දායක මුදල් බැංකු ගිණුමට (අංක 100199026658) රැස්කර තිබීමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් උක්ත වියදම් දැරීමත් හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය තුළ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව සහ සමාජිකයින්ගේ නම, පාසල ඇතුලත් උපලේඛනයන් නඩත්තු නොකිරීම නිසා අරමුදලට ලැබිය යුතු මුදල, ලද මුදල හා හිඟ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ආ) දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය වර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කළද, එම මුදල් නිවැරදිව අරමුදල සඳහා ලැබුනේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

3.4 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ කටයුතු පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

විගණකාධිපති

(11)

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ඊඩබ්/ඩී/ඩීඔපී/02/19/17 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 මැයි 3 වැනිදින

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්,

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

**රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

RECEIVED 03 JUN 2019

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය වියාචනය**

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
NAOSL
NATIONAL AUDIT OFFICE

1.2 මතය වියාචනය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූල නොවීම.

ප්‍රමිතිය ප්‍රකාරව ආදායම් හා වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු වුවද, එයට පටහැනිව මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති මඟින් අරමුදලට ලැබෙන මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කරන බව හෙළිදරව්කර තිබුණි.

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

ආයෝජන වටිනාකම රු. 642,000,000 ක් සඳහා 2018 කාලපරිච්ඡේදයට අදාළව පොළී ආදායම රු.1,772,975ක් අඩුවෙන් හා රඳවා ගැනීමේ බදු රු. 2,079,025 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන්,සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ආදායම රු. 3,852,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) විගණනය සඳහා සාක්ෂි නොවීම.

අරමුදල යටතේ දායක වී ඇති දායකයින්ගේ කේවල ගිණුම් නිසි පරිදි පවත්වා ගැනීමට කටයුතුකර නොතිබීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනිවාර්ය දායක මුදල් ගිණුමේ ශේෂය රු.24,307,762,204ක්, ස්වේච්ඡා දායක මුදල් ගිණුමේ ශේෂය රු. 37,786,900ක් සහ රජයේ දායක මුදල් ගිණුමේ ශේෂය රු.37, 726,385,705ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

(ඈ) පැහැදිලි නොකළ වෙනස්කම්

2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මාසික ගිණුම් සාරාංශ මඟින් විවිධ රාජ්‍ය ආයතන විසින් අරමුදලට සිදුකරන ලද හර හා බැර කිරීම්වලට අදාල හඳුනා නොගත් ශේෂ නිරවුල් කරන තෙක් ගැලපුම් ගිණුමට ගලපා තිබුණි. එම ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට හර ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු. 29,448,892ක් වුවද, ඊට අදාල උපලේඛණය අනුව ශේෂය රු. 24,158,246 ක් වූයෙන් රු. 5,290,646 ක වෙනසක් නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (අ),(ඇ),(ඇ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**3. මෙහෙයුම් සමාලෝචනය**

3.1 ලැබිය යුතු ගිණුම්

2018 දෙසැම්බර් 31 දිනට උපලේඛණය අනුව ගැලපුම් ගිණුමේ ශේෂයෙන් රු. 19,854,328 ක් වර්ෂ 1ක සිට වර්ෂ 3 ක් දක්වාත් රු. 3,187,045 ක් වර්ෂ 4ක සිට වර්ෂ 6ක් දක්වාත් රු. 874,093 ක් වර්ෂ 7ක සිට වර්ෂ 10ක් දක්වාත් සහ රු. 125,362 ක් වර්ෂ 11 ට වඩා පැරණි ශේෂයන් විය.

3.2 නීති රීති විධිවිධානවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති,රීති හා විධිවිධානවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1942 රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥා පනතේ (621 අධිකාරය)<br>(I) 16 (1ආ) සහ 20 (ආ) වගන්ති | අකාර්යක්ෂමභාවය, විෂමාචාරය යන හේතුව මත දායකයකු සේවයෙන් පහ කරනු ලබන විට හෝ අරමුදලේ දායකයකු රාජ්‍ය සේවයෙහි විශ්‍රාම වැටුප් හිමි ධූරයකට පත්කරනු ලැබූ විට නිලධාරියා වෙනුවෙන් රජයේ දායකය හා පොලිය එකාබද්ධ අරමුදලට නැවත ගෙවිය යුතු වුවත් 2018 වර්ෂයට අදාල රු. 313,813,696 ක් නොගෙවූ |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | |
|---|---|
| | රජයේ දායක මුදල් හා පොලිය ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |
| (III) 25 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙසැම්බර් 31 දිනට සාමාජික ගිණුම්වල ඇති ශේෂයන් දායකයින් වෙත දැනුම් දිය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජූලි 23 දිනැති අංක 07/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය 08 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන අනුව මාසික ගිණුම් සාරාංශ මගින් දායක මුදල් බැරකිරීම සිදු නොකළ යුතු වුවත් 2018 වර්ෂය තුල ආයතන 13කින් දායක මුදල් රු. 50,353,743 ක් මාසික ගිණුම් සාරාංශ මගින් බැර කර තිබුණි. |

3.3 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් දායකය ලෙස ආයතන විසින් එවන චෙක්පත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ තැපැල් අංශයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් අංශය වෙත ලබා දීමට මාස 01 සිට මාස 14 දක්වා වූ කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය.

(ii) රජයට ලැබෙන ආදායම හැකිතාක් ඉක්මනින් උපලබ්ධි කිරීමට කටයුතු කළ යුතු වුවත් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ලැබෙන චෙක්පත් දින 8 සිට මාස 1 ½ ක් ප්‍රමාදයකින් බැංකු ගත කර තිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(iii) 2018 සැප්තැම්බර් මස කරන ලද නියැදි පරික්ෂණයට අනුව 2018 ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසයන්හි ආපසු හරවා යවන ලද නමුත් නැවත දායක මුදල් ගෙන්වාගෙන නොතිබුණු වටිනාකම රු. 1,989,639 ක් වූ චෙක්පත් 43 ක් නිරීක්ෂණය විය.

3.4 කාර්යසාධනය

---------------

විශ්‍රාම වැටුප් නොලැබෙන රජයේ ඇතැම් සේවකයන් හට ප්‍රතිලාභ ප්‍රදානය කිරීම මූලික අරමුණුගතව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල පිහිටුවා තිබුණි. 2018 ජනවාරි 01 දිනට නොගෙවූ අයදුම්පත් 954 ක් තිබූ අතර වර්ෂය තුළ අරමුදලේ සාමාජිකයින් විසින් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ඉදිරිපත් කල අයදුම්පත්‍ර සංඛ්‍යාව 3555 ක් විය. ඒ අතුරින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 3917 ක් සඳහා රු. 354,979,757 ක් ගෙවීම් කර තිබූ අතර අයදුම්පත් 592 ක් සඳහා ගෙවීම් කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්ර්ඩබ/ඩී/ඩීඔපී//02/19/25 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 ජුලි 3 දින

ගණන් දීමේ නිලධාරී

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 20 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

2

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

19-6

3

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී බව ප්‍රකාශ කල නොහැකි විය.

(ආ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු අනාවරණය විය.

(අ) 2018 වර්ෂය සඳහා ආදායම් ශීර්ෂ 20.04.01.00 යටතේ දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ආදායමෙහි භාණ්ඩාගාර මුද්‍රිත හා මූල්‍ය ප්‍රකාශන අනුව රු. 870,380 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ආ) පුනරාවර්තන වියදම්**

මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු විසින් දරන ලද වියදම, මාසික ගිණුම් සාරාංශ හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අතර වෙනසින් නිරූපණය වන අතර ඒ අනුව එම වෙනස රු. 34,533,914,542 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල අක් මුදල් ගැලපුම් ගිණුමේ එම අගය රු. 33,407,328,729 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 1,126,585,813 ක් අඩුවෙන් දක්වා තිබුණි.

**1.6.2 දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව ආරම්භක ශේෂය රු. 1,985,439,603 ක්ද මිලදී ගැනීම් රු. 33,762,583 ලෙසද අවසන් ශේෂය රු. 2,009,824,699 ක්ද වුවත් ස්ථාවර වත්කම් ලේඛනයට අනුව ඒවා පිළිවෙලින් රු. 1,986,066,147 ක්ද, රු. 33,630,783 ක් හා රු. 2,010,319,443 ක් වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල අවසන් ශේෂය රු. 494,744 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

**2- මූල්‍ය සමාලෝචනය**

**2.1 ආදායම් කළමනාකරණය**

**(අ) ආදායම් සංකේත අංකය 20:04:01:00 (මධ්‍යම රජය)**

සමාලෝචිත වර්ෂය තුලදී ආදායමෙන් ආපසු ගෙවන ලද රු. 588,412 ක් තහවුරු කර ගැනීම සඳහා 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව අදාල ආයතන වලින් හර නිවේදන ලබාගෙන නොතිබුණි.

5

(ආ) ආදායම් සංකේත අංකය 20:04:02:00 - සමාජ සංරක්ෂණ දායක මුදල් - (පළාත් සභා)

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ශීර්ෂ අනුව ආදායම් සංකේතයට බැර කර තිබූ දායක මුදල් හා හිඟ මුදල් දායකයන් අනුව නිශ්චිතව හඳුනාගත හැකි වන පරිදි සුදුසු දත්ත පද්ධතියක් ඇතුළු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුලදී මෙම ශීර්ෂය සඳහා රැස් කරන ලද රු.මිලියන 8,683 ක් වූ ආදායම වර්ෂය සඳහා ආදායම් ලැබීම්, හිඟ ආදායම් ලැබීම් ලෙස වෙන්කර හඳුනා ගැනීමටත් දායකයා අනුව වෙන්කර ගැනීමටත් නොහැකි වී තිබුණි.

(ii) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.1 වගන්තිය ප්‍රකාරව වැන්දඹු අනත්දරු දායක මුදල් සඳහා අයකරනු ලබන චෙක්පත් ආයතනික මට්ටමින් එවන්නේ නම් ඊලඟ මාසයේ 5 වැනි දිනට පෙර ගෙන්වා ගත යුතු වුවත් දින 70 සිට දින 184 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණු අතර චක්‍රලේඛයේ 2.2 වගන්තිය ප්‍රකාරව පළාත් සභා විසින් සියළුම කාර්යාලවල දායක මුදල් වෙනුවෙන් එක් චෙක්පතක් නිකුත් කරන්නේ නම් සෑම මසකම අයකිරීම් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර ගෙන්වා ගැනීමට කටයුතු කල යුතු වුවත් දින 10 සිට දින 54 දක්වා ප්‍රමාදයන් දක්නට ලැබුණි.

(iii) සෘජුවම චෙක්පත් මඟින් දායක මුදල් එවනු ලබන ආයතන 03 ක රු. 573,809 වටිනා චෙක්පත් 06 ක් විවිධ හේතු මත 2018 පෙබරවාරි 20 සිට 2018 අප්‍රේල් 26 දක්වා නැවත හරවා යවා තිබූ නමුත් 2019 මැයි 06 වන විට වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් එම දායක මුදල් නැවත අයකරගෙන නොතිබුණි.

2.2 වියදම් කළමණාකරණය

නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 04 කට සහ මූලධන වැය විෂයයන් 02 කට අදාළව පිළිවෙලින් මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 1,202,130,000 ක් හා රු. 1,215,000 ක් වූ අතර එම වැය විෂයයන්ට අදාලව මුළු වියදම පිළිවෙලින් රු 156,994,573 ක් හා රු.885,996 ක් විය. ඒ අනුව වැය විෂයයන්ට අදාලව ඉතිරිවීම් පිළිවෙලින් රු. 1,045,135,427 ක් හා රු. 329,004 ක් විය. මෙයින් වැය විෂයය එකක ඉතිරිය සියයට 100 ක් වූ අතර ඉතිරි වැය විෂයයන් 05 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 17.5 සිට සියයට 28.5 දක්වා පරාසයක පැවතුණි.

6

(ආ) සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 06 ක් සඳහා වෙන් කර ගන්නා ලද රු. 138,117,277,300 ක ප්‍රතිපාදනයන්ට අමතරව මු.රෙ 66 හා 69 යටතේ ශුද්ධ මාරු කිරීම් රු. 374,738,000 ක් අඩුකල පසුද රු. 1,299,195,160 ක් ඉතිරිව පැවතුණි.

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.1 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

(ඇ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, 2018 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 12 කට පිළිතුරු ලබා දී නොතිබුණි.

7

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

**නිරීක්ෂණය**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 170 (2) (අ) (ආ) (ඇ) (ඈ) (ඉ) | 5,991,000 | 2018 විශ්‍රාමික දිනය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය සඳහා ආයතන 15 කින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබූ පෞද්ගලික මුදල් රු. 5,991,000 ක 2019 ජූලි 08 වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ii) | විශ්‍රාම වැටුප් චක්‍රලේඛ<br>2014 අප්‍රේල් මස 07 වන දිනැති සහ අංක 01/2011 (සංශෝධන) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | | සෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකම මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ක්‍රමවත් පාලන ගිණුමක් පවත්වාගෙන යාම අනිවාර්ය කර තිබේ. නියැදි පරීක්ෂණයකට අනුව මීගමුව,මීරිගම, ගම්පහ, වරකාපොල සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |
| (iii) | 2013 දෙසැම්බර් 03 දිනැති අංක 06/2013 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2011 ජූනි 14 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි අංක 02 | | නොගෙවූ විශ්‍රාම වැටුප් නියමිත මාසයට පසු මාසයේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු වුවත් එසේ නොකර අලව්ව, මීරිගම, ගම්පහ සහ වරකාපොල යන ප්‍රාදේශීය ලේකම් කාර්යයාල 04 ක එකතු වටිනාකම රු. 4,567,674 ක් පොදු තැන්පත් ගිණුමේ මාස 02 සිට මාස 12 දක්වා කාලයක් රඳවා ගෙන ආපසු එවීම සිදුකර තිබූ බව නියදි පරීක්ෂණයකදී හෙළිදරව් විය. |
| (iv) | 2009 ජූනි 08 දිනැති සහ | | වාර්ෂිකව විශ්‍රාමිකයින්ගේ ජීවිත සහතික |

8

| | |
|---|---|
| අංක 11/2009 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | ඉදිරිපත් කිරීමේදී ජීවන සහතිකය ග්‍රාම නිලධාරි විසින් අත්සන් කර ඉදිරිපත් කලයුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල දී වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයන්ගේ අත්සනින් ඉදිරිපත් කළ ජීවිත සහතික මත ගෙවීම් කළ අවස්ථා 11 ක් පැවතුණි. |
| (v) 2009 ජනවාරි 07 දිනැති විශ්‍රාම වැටුප් 1/2009 චක්‍රලේඛයේ 08 ඡේදය | ආබාධිත දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීමේ කටයුතු අධීක්ෂණය පූර්ණ වශයෙන්ම ග්‍රාම නිලධාරීන්ට පැවරිය යුතුය. නිසි රැකවරණය සැලසෙන බවට ග්‍රාම නිලධාරි වගබලා ගත යුතු අතර ත්‍රෛමාසික වාර්තාවක් ගොනුවට ඇතුලත් කල යුතු වුවත් නියැදි පරීක්ෂාවේදී ගම්පහ, මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. |
| (vi) 2016 අප්‍රේල් 27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2016 හා 2015 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2015 | රු. 3,500 ක්වූ මාසික අන්තර් දීමනාව 2016 ජනවාරි 01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා ලද විශ්‍රාමිකයන්ට හිමිනොවන නමුත් ඊට පටහැනිව වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමික නිලධාරීන්ට 3 දෙනෙකුට උක්ත අන්තර් දීමනාව ලෙස රු. 261,991 ක් ගෙවා තිබුණි |

**2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 371(2)(ඇ) ප්‍රකාරව අත්තිකාරම අදාල කාර්යය අවසන් කල වහාම පිය විය යුතු වුවද, රු. 50,000 ක්වූ අත්තිකාරම් 4 ක් පියවීමට අත්තිකාරම් ලබාගත් දින සිට දින 42 සිට 114 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කල රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුමේ සැසඳුම් ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට වැඩ තහනම් කර ඇති සේවය අතහැර ගොස් ඇති හා මාරු වී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතුව තිබුණු ශේෂ වල එකතුව රු. 3,290,000 ක් විය. එම හිඟ හිටි ශේෂ අතරින් වර්ෂ 1 ක සිට 5 දක්වා කාලයක සිට නිලධාරින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු. 744,602 ක් විය. තවද, වර්ෂ 5ට වැඩි කාලයක සිට නිලධාරින් 14

19-ශු

9

දෙනෙකුගෙන් අයකර ගත යුතු හිඟ හිටි ශේෂය රු. 572,236 ක් වූ නමුත් එම හිඟ හිටි ශේෂ 2018 දෙසැම්බර් 31 දක්වා නිරවුල් කරගෙන නොතිබුණි.

**2.6 තැන්පතු**

දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ක්ෂේත්‍රගත නිලධාරීන් 05 දෙනෙකු වෙනත් සේවයකට යාම නිසා එම නිලධාරීන්ට ලබාදුන් යතුරු පැදි සඳහා අයකර ගන්නා ලද රු. 696,500 ක මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යැවීමකින් තොරව 2018 ඔක්තෝබර් සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3 -මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2018 වර්ෂයට අදාල වාර්තාව 2019 ජූලි 08 වන විටත් සභාගත කර නොතිබුණි.

**3.2 ප්‍රසම්පාදනයන්**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) දෙපාර්තමේන්තුවේ අංශ 6 ක නවීකරණ කිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට භාර දී තිබූ අතර ඔහු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්‍රයේ සඳහන් කාර්යයන් හා විගණනය මගින් භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය කල පරිදි ඇස්තමේන්තුවට අනුව කාර්යයන් සිදුකර නොතිබීයදී රු. 332,151 ක්ද ඉටු නොකල කාර්යයන් සඳහා රු. 1,132,748 ක් ද වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය නවීකරණය කිරීම සඳහා බිල්පත් පියවීමේදී ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු රු. 122,939 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) රජයේ විගණන අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ විෂමතා හා දායක මුදල් අංශ සඳහා වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීම සහ සවි කිරීමේදී ඉටු නොකළ කාර්යයන් සඳහා රු. 114,954 ක් වැඩිපුර ගෙවා තිබුණි.

10

### 3.3 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(අ) ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මඟින් සිවිල් හා වැන්දඹු ලෙස විශ්‍රාම වැටුප් 02 ක් ලබමින් සිට 2012 මැයි 30 දින මිය ගිය විශ්‍රාමික නිලධාරිනියකගේ විශ්‍රාම වැටුප 2012 ජූනි සිට 2016 දෙසැම්බර් දක්වා මාස 55 ක් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට බැර කර තිබුණි. එසේ බැර කරන ලද රු. 2,696,303 ක් ATM කාඩ්පත භාවිතා කර විශ්‍රාමිකයාගේ පුතා විසින් ඉවත් කරගෙන තිබුණි. මෙයින් රු. 308,052 ක මුදලක් ඔහු විසින් දෙපාර්තමේන්තුවට ගෙවා ඇතත් ඉතිරි රු. 2,388,251 ක මුදල 2019 ජූනි 30 වන විටත් අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ආ) විශ්‍රාමික අංක 01- 600772 යටතේ විශ්‍රාම වැටුප් ලබමින් සිට 2013 නොවැම්බර් 07 දින මියගිය නිලධාරිණියකගේ 2013 දෙසැම්බර් සිට 2016 අප්‍රේල් මස දක්වා මාස 29 ක විශ්‍රාම වැටුප වූ රු. 582,423 ක් විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට බැර කර තිබුණි. වරින් වර ATM කාඩ්පතක් භාවිතා කරමින් මෙම ගිණුමේ මුදල් ලබා ගෙන තිබූ අතර 2019 ජූනි 30 වන විටත් ඉවත් කරගෙන තිබූ රු. 581,916 ක් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව පියවර ගෙන නොතිබුණි.

(ඇ) විශ්‍රාමික අංක 01-600575 යටතේ ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් තාවකාලික විශ්‍රාම වැටුපක්ද, විශ්‍රාමික අංක 01 – 620195 යටතේ මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ස්ථිර විශ්‍රාම වැටුපක්ද වශයෙන් 1991 ජනවාරි සිට 2016 පෙබරවාරි 29 දක්වා වසර 20 ක කාලයක් විශ්‍රාම වැටුප් 02 ක් නිලධාරියෙකු විසින් ලබාගෙන තිබුණි. මෙලෙස ගම්පහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් වැඩිපුර ලබාගත් මුදල රු. 1,872,387 ක් වී තිබුණු අතර 2016 පෙබරවාරි 10 සිට විශ්‍රාම වැටුප් ගෙවීම නවතා තිබූ නමුත් වැඩිපුර ගෙවා තිබූ මුදල් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්‍රාම වැටුප් අංක 21-0-105353 දරණ විශ්‍රාමික නිලධාරිනිය 2011 මාර්තු 11 වන දින මියගොස් තිබුණු අතර විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියෙහි විශ්‍රාමිකයාගේ උපන් වර්ෂය 1930 ලෙසත් ජාතික හැඳුනුම්පත් අංකය 608212523V ලෙසත් සඳහන්ව තිබුණි. ජාතික හැඳුනුම්පත් අංකය ඇයගේ දියණියගේ වූ අතර මිය ගිය දින සිට 2018 ජූලි මස විශ්‍රාම වැටුප් ගෙවීම නවතා දමන තෙක් මවගේ විශ්‍රාම වැටුප ලෙස රු. 1,562,470 ක් දියණිය විසින් සාවද්‍ය ලෙස ලබාගෙන තිබුණි.

2011 වර්ෂයෙන් පසු ජිවත් වීමේ සහතිකයක් නොමැති වීම මත විශ්‍රාම වැටුප් ගෙවීම තවකාලිකව නතර කිරීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් නිලධාරින් විසින් කටයුතු කර නොතිබුණු අතර විශ්‍රාම වැටුප් බද්ධ බැංකු ගිණුමට බැර කර තිබුණි.

11

### 3.4 පාඩු හා හානි

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන 1 හි සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් අයකර ගත යුතු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් වටිනාකම රු.මිලියන 591 ක් වී තිබුණි. මෙම මුදල් වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. මි. 8 කින්ද වර්ෂ 5 සිට වර්ෂ 10 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු. මි. 37 කින් හා වර්ෂ 5 ක අඩු කාලයකට අයත් රු. මි. 546 කින් ද සමන්විත වූ නමුත් මෙම වැඩිපුර ගෙවීම් අයකර ගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) හානි හා පාඩු ලේඛනයේ සඳහන් 2017 දෙසැම්බර් 31 හා 2018 ජනවාරි 01 අවසන් හා ආරම්භක ශේෂ සැසඳීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් කරනු ලබන අය කිරීම්වලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 213 ක සහ දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන අය කිරීම්වලට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 231 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

(ඇ) 2015 ජූලි 05 දිනැති සහ අංක 5/2015 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාමිකයාට/දායකයාට වයස අවුරුදු 55 තෙක් අවසන් වරට සේවය කල ආයතනය විසින් වැටුප් ගෙවන්නේ නම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකළ යුතු වුවත් ඊට පටහැනිව වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එක් වැන්දඹු විශ්‍රාම වැටුපක් සංශෝධනය කර 2018 ඔක්තෝබර් දක්වා රු. 156,081 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය පරීක්ෂා කිරීමේදී විශ්‍රාමිකයකු විශ්‍රාම වැටුප් අංක 521426 යටතේ සිවිල් විශ්‍රාම වැටුපක් සහ විශ්‍රාම වැටුප් අංක 02-1101946 යටතේ ගුරු විශ්‍රාම වැටුපක් ලෙස විශ්‍රාම වැටුප් 2ක් වර්ගයා සටහන් 2 ක් ඉදිරිපත් කර ලබාගෙන තිබුණි. මෙම පුද්ගලයාට විශ්‍රාම වැටුප් අංක 01-521426 යටතේ 2010 වර්ෂයේ සිට 2019 ජනවාරි දක්වා රු. 1,535,224 ක් හා විශ්‍රාම වැටුප් අංක 02-1101946 යටතේ 2011 වර්ෂයේ සිට 2019 ජනවාරි දක්වා රු. 3,562,555 ක් ගෙවා තිබුණි. මේ පිළිබඳ පරීක්ෂා කර වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

### 3.5 අනාර්ථික ගනුදෙනු

සහායක සේවා කවුළු ක්‍රියාකරුවන් තනතුර 02 ක් කොන්ත්‍රාත් පදනමට බඳවා ගැනීම් සඳහා 2018 ඔක්තෝබර් 05 දින පළ කරන ලද පුවත්පත් දැන්වීම් සඳහා රු. 156,984 ක් වැයකර තිබුණත් 2019 මැයි 29 දින වන විටත් බඳවා ගැනීම සිදු කර නොතිබුණි.

12

.6 **කළමනාකරණ දුර්වලතා**

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකල මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක ලිපිගොනු සංඛ්‍යාව 669 ක් වී තිබුණි.

(ආ) අංක 1719/3 හා 2011 අගෝස්තු 15 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ සඳහන් පරිදි උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් වසර 05 කට වරක් වෛද්‍ය මණ්ඩලයට යොමු කල යුතු වුවත් මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල උපතින් පූර්ණ ආබාධිත නොවන තැනැත්තන් කිසිවෙකුත් කිසිම දිනක වෛද්‍ය මණ්ඩලයකට යොමුකර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2014 ඔක්තොබර් 16 දිනැති චක්‍රලේඛ ලිපි අංක 04 පරිදි ප්‍රථම මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කර උපරිම වශයෙන් මාස 03 ක් ගෙවෙන විටදී විශ්‍රාම වැටුප් ලිපිගොනුව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබිය යුතු වුවත් මීගමුව, ගම්පහ සහ වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 හි මාස 3 ක් ගත වූ පසුත් විශ්‍රාම වැටුප් ලිපිගොනු 65 ක් ලැබී නොතිබුණි. ගොණුව ලැබිය යුතු දින සිට ප්‍රමාද කාලය මාස 01 සිට මාස 16 දක්වා වී තිබුණි.

(ඈ) විශ්‍රාමිකයින් මියයාම කාලිනව දැනුම්නොදීම.

---

i. ග්‍රාම නිලධාරි විසින් විශ්‍රාමිකයන්ගේ මියයාම් නියමිත දිනට දැනුම් නොදීම හේතුවෙන් ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ලබා මියගිය විශ්‍රාමිකයින්ගේ බැංකු ගිණුම්වලින් විශ්‍රාම වැටුප් ලෙස ගෙවූ රු. 2,518,420 ක් ආපසු ගෙන්වා ගැනිමට විශ්‍රාමිකයා මියගිය දින සිට වසර එකකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණි. මෙ අන්දමට නොගෙවූ විශ්‍රාම වැටුප් වෙනත් බැංකු ගිණුම්වල අකර්මන්‍යව පවත්නා අවස්ථා නිරික්ෂණය විය.

ii. විශ්‍රාමිකයා මියගිය බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් නොවීම හේතුවෙන් මියගිය විශ්‍රාමිකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවා තිබූ අතර ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2016 වර්ෂයේ මියගිය විශ්‍රාමිකයන් 10 කට වැඩිපුර ගෙවූ රු. 336,378 ක් හා 2017 වර්ෂයේ මියගිය විශ්‍රාමිකයින් 7 දෙනෙකුට වැඩිපුර ගෙවූ රු. 750,390 ක් වූ සම්පූර්ණ මුදලම 2018 දෙසැම්බර් මාසය වන විටත් අයකර ගෙන නොතිබුණි.

19 (ශ)

13

(ඉ) ලේඛනාගාරය නිසි ලෙස නඩත්තු නොකිරීම.

ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 අප්‍රේල් 30 දිනට දත්ත පද්ධතිය අනුව විශ්‍රාමිකයින් 11,274 ක් සිටින අතර එයින් විශ්‍රාමිකයින් 10,963 කගේ ලිපිගොනු ලේඛනාගාරයේ තබා තිබුණි. ලේඛනාගාරයේ ලිපිගොනු ඉක්මනින් සොයාගත හැකි ආකාරයට වර්ගීකරණය කර අසුරා නොතිබුණි. ලිපිගොනු අපිලිවෙලට අසුරා තිබු අතර ලිපිගොනු දූවිලි හා මකුළුදැල් බැදී විනාශ වී යන තත්ත්වයට පත්ව තිබු අතරම පවත්නා ස්ථානය අනුව ලිපිගොනුවලට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැති බවද නිරීක්ෂණය විය. තවද අළුතින් සකස් කර තිබු ලේඛනාගාරය විගණිත දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) අංක 9/2008 (සංශෝධන II) දරන 2018 ජුලි 17 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සේවා කාලය සම්පූර්ණ නොවූ විශ්‍රාමිකයින් සඳහා ගෙවනු ලබන දුබලතා විශ්‍රාම වැටුප ගෙවීම නතර කර 59 කාණ්ඩය යටතේ ගෙවනු ලබන මූලික වැටුප සමඟ දුබලතා විශ්‍රාම වැටුප දත්ත පද්ධතිය තුල DSA වෙන්කර දැක්විය යුතු වුවත් වරකාපොළ සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විශ්‍රාම වැටුප් ඒකාබද්ධ කර නොතිබු බව නිරීක්ෂණය විය.

(උ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවකරණ වාර්ථා අනුව විශ්‍රාමිකයින් 3 දෙනෙකුගේ 2018 ජනවාරි 01 දිනට අයවීමට තිබු රු. 695,631 ක වැඩිපුර ගෙවීම 2018 ජුලි 07 දින වන විටත් එසේම පැවතුණු අතර මෙයින් රු. 582,423 ක් වූ වැඩිපුර ගෙවීමක් අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණි.

(ඌ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 ක වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් නැවත අයකිරීම පිළිබඳ කාර්තු වාර්තා අනුව අවස්ථා 09 කදී රු. 745,299 ක් වූ වැඩිපුර ගෙවීම, වාර්තා වූ දිනයේ සිට නැවත අයකර ගැනීම ආරම්භ කිරීමට මාස 08 සිට මාස 16 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණි.

(එ) විශ්‍රාම වැටුප් ගෙවනු ලබන සෑම විශ්‍රාමිකයකු සඳහාම විශ්‍රාම වැටුප් ගොනුවක් පවත්වාගෙන යායුතු වුවද මීගමුව, මීරිගම , ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 6 ක ලිපිගොනු නොමැතිව විශ්‍රාමිකයින් 512 කට විශ්‍රාම වැටුප් ගෙවමින් පැවතුණි.

(ඒ) මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විශ්‍රාමිකයින් 54 දෙනෙකු සඳහා සකස් කර තිබු තාවකාලික ගොනුවල ලියවිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවෙන් පිටත පදිංචි විශ්‍රාමිකයින් 23 දෙනෙකු මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබා ගනිමින් තිබුණි.

14

(ඔ) විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතියේ ජාතික හැඳුනුම්පත් අංක නොමැතිව මීගමුව, මීරිගම, ගම්පහ, අලව්ව, වරකාපොල, වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 06 ක විශ්‍රාම වැටුප් ගෙවීම් සිදුකරන අවස්ථාවන් 99 ක් පවතින බව නිරීක්ෂණය විය.

**4- මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2018 දෙසැම්බර් 31 දිනට වූ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 24 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1078 | 942 | 136 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 57 | 18 | - |
| (v) | වෙනත් (අනියම්) | 06 | 08 | - | 02 |
| | එකතුව | 1204 | 1037 | 169 | 02 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටි රීති 1 වැනි කාණ්ඩයේ 18 වැනි පරිච්ඡේදයේ විධි විධාන අනුව විශ්‍රාම වැටුප් නිලධාරීන් සහ ලේඛණ සහකාර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය ප්‍රකාරව එකම සේවා ස්ථානයක වසර 05 කට වඩා වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අනිවාර්යයෙන් ස්ථාන මාරු කෙරෙන බව දක්වා තිබුනද නිලධාරීන් 8 දෙනෙකු වසර 10 කට වඩා වැඩි කාලයක්ද, නිලධාරීන් 11 දෙනෙකු වසර 6 ත් 10 ත් අතර කාලයක්ද විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සේවයේ යෙදී තිබුණි.

Athenagama

ටී.ජී.අයි. පද්මිණි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට